# ත්‍රිලක්ෂණ විනිශ්චය

**ත්‍රිලක්ෂණය පිළිබඳ සුගතවාදය හෙවත් ථේරවාදී මහා විහාර මතය**

# පටුන

හැඳින්වීම ........ 4

.1අර්ථ කථාවන්හි පැමිණි ත්‍රිලක්ෂණ වචනාර්ථ ........ 6

**ත්‍රිලක්ෂණයන්ගේ වචනාර්ථ ........ 7**

**මෙකී ත්‍රිලක්ෂණයන්ගේ පදගතාර්ථය අර්ථකථාවන්හි මෙසේ දැක්වේ. ........ 9**

.2අනිත්‍යය පිළිබඳව දතයුතු කරුණු ........ 10

- **සම්මුති සත්‍ය ........ 10**
- **පරමාර්ථ සත්‍ය ........ 10**

**නාමරූපයන්ගේ ක්‍ෂණික නිරෝධය පිළිබඳ තවත් ත්‍රිපිටක නිදර්ශන ........ 13**

3. නාමරූපයන්ගේ ක්‍ෂණික නිරෝධය පිළිබඳව අර්ථකථා සාධක පාඨ ........ 15

**I. අලගද්දූපම සූත්‍ර අර්ථකථාව ........ 15**

**II. මහානිදාන සූත්‍ර අර්ථකථාව ........ 16**

**III. විශුද්ධ මාර්ගය ........ 16**

**IV. පටිසම්භිදාමග්ගප්පකරණ අර්ථකථාව ........ 17**

**නාමරූපයන්ගේ ක්ෂණික නිරෝධය පිළිබඳ ටීකාවන්හි අන්තර්ගතය ........ 18**

4. අනිත්‍යතාවය පිළිබඳව සුප්‍රකට මෑතකාලීන ථේරවාදී භාවනා ආචාර්යවරුන්ගේ මත ........ 20

- ❖ **මහා සී භාවනා ක්‍රමය තුළින් අනිත්‍යතාවය ........ 20**
- ❖ **භාවනා ක්‍රමය තුළින් අනිත්‍යතාවය ”අවුක්-පා“ ........ 21**
- ❖ **විදර්ශනා භාවනා ක්‍රමය රේරුකානේ චන්‍දවිමල මහතෙරුන් වහන්සේ - ........ 22**

5. දුක්ඛ ලක්‍ෂණය පිළිබඳව දතයුතු කරුණු ........ 24

**I. පටිසම්භිදාප්‍රකරණය - අභිඤෙය්‍ය නිර්දේශය ........ 24**

**II. සංයුක්තනිකාය - රාහුල සංයුක්තය ........ 25**

**III. පටිසම්භිදාමග්ගප්පකරණය සම්මස්සන ඥාන නිර්දේශය ........ 26**

6. අනාත්ම ලක්ෂණය පිළිබඳව දත යුතු කරුණු ........ 27

**I. පටිසම්භිදාමග්ගප්පකරණය -ලක්ඛණත්තික නිද්දේසය........ 27**

**II. විශුද්ධිමාර්ගයේ මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි නිර්දේශය ........ 28**

**III. ධම්මපදාර්ථකතාව ........ 29**

7. සූත්‍ර දේශනා තුළින් නිවන් මග ........ 30

**I. දීඝ නිකාය මහා නිධාන සූත්‍රය ........ 30**

**II. සංයුක්ත නිකාය - භූත සූත්‍රය........ 35**

8. සප්ත විශුද්ධිය හා සතර මහාපදේශ තුළින් ත්‍රිලක්ෂණය........ 37

**I. ථේරවාදී විපස්සනා ප්‍රතිපදාව සප්ත විශුද්ධිය - ........ 37**

**II. සතර මහා අපදේශ න්‍යායෙන් ත්‍රිලක්ෂණය ........ 39**

○ මහා පරිනිබ්බාන සූත්‍රයෙහි මහා අපදේශ -........ 39

○ නෙත්තිප්ප්‍රකරණය මහා අපදේශ - ........ 40

○ නෙත්තිප්ප්‍රකරණ අර්ථ කථාව මහා අපදේශ -........ 41

○ ත්‍රිලක්ෂණ අර්ථයන් සූත්‍රයෙහි බහාලීම ........ 42

○ විනයෙහි සංසන්දනය කිරීම........ 43

○ ධර්මතායෙහි හෙවත් පටිච්ච සමුප්පාදයෙහි බහාලීම........ 43

**III. අන්තර්ගතය සැකෙවින් ........ 45**

## හැඳින්වීම

අති දීර්ඝ කාලයක් මුළුල්ලේ සතර අපා දුක් විඳිමින් අනේක සෝක පරිදේව දුක්ඛ දෝමනස්සයන්ගෙන් ගැවසීගත් ලෝක සත්වයාට ඇති එකම සැනසිල්ල බුද්ධෝත්පාදය යි. බලවත් අකුශල කර්ම ඇති ඉතා බහුතරයක් සත්ත්‍වයෝ බුද්ධෝත්පාදයකදී ධර්මශ්‍රවණය කළ නොහැකි බාහිර සක්වලවල්හි හෝ සතර අපායන්හි උපදිත්. ඉතා බලවත් කුශල කර්ම ඇති අල්පතරයක් ම සත්ත්‍වයෝ බුද්ධෝත්පාදයේ දී මේ මංගල සක්වලෙහි සුගති ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ලබති. එහිදී සම්පූර්ණ කරන ලද බෝධිසම්භාර ධර්ම ඇති සත්ත්‍වයෝම ධර්මය අසා සෝවාන් ආදී සතර මගඵලයන්ට පැමිණ සසර දුකින් එතෙර වෙති.

නිර්වාණාධිගමයට ප්‍රමාණවත් පාරමී ධර්ම නොපිරුණු පෘථග්ජන සත්ත්‍වයෝ මතු මහඵල පිණිස බෝධිපාක්ෂික ධර්ම වඩති. එසේ පාරමී පුරන්නවුන්ට බුදුන් පිරිනිවි පසු ඇති එකම සැනසිල්ල පිරිසිදු විපස්සනා ප්‍රතිපදාවත් කල්‍යාණමිත්‍ර සම්පත්තියත් පමණි. ඉදින් කල්‍යාණ මිත්‍රයන් සිටියේද නිවැරදි විපස්සනා ප්‍රතිපදාවක් නැති වුවහොත් ඒ සැනසිලි මාත්‍රයද සිස්ව යනු ඇත.

ශාසනාන්තර්ධානය දක්වා කාලය තුළ මේ නිවන් මග වසාලනු පිණිස විවිධ අධර්මවාදී පිරිස් සසුන තුළ බිහි වන්නාහ. දෙවැනි ධර්ම සංගායනාවෙන් බැහැර කළ විපරීත දෘෂ්ටි දැරූ මහාසාංඝිකයන් ද තෙවැනි ධර්ම සංගායනාවෙන් බැහැර කළ විපරීත දෘෂ්ටි දැරූවෝ ද ඉන් ඇතමෙක්ය. මෙලෙස වරින්වර සසුන තුළ මෙබඳු පිළිල පහළ වීම ස්වභාවික සංසිද්ධියකි. අනිත්‍යතාවේ ප්‍රතිඵලයකි. බුදු සසුන ද කෙදිනක හෝ අතුරුදහන්ව යා යුතුය. මේ ස්වභාවධර්ම නියාමය කිසිවකුට ඉක්මවා ලිය නොහැක.

නමුදු මතු වසර පන්දහසක් කල් පවත්නා සේ සසුන පැවතීමට හැකිවන වන සේ සසුන් පිළිල ඉවත් කිරීමට සැම විටම ථෙරවාදීහු ක්‍රියා කළහ. දෙවන සංගීතියේ කාකණ්ඩපුත්ත යස මහරහතන් වහන්සේ ද තෙවන සංගීතියේ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ ද ඊට නිදසුන් වූවෝය.

මෙකල ද සත්ත්‍වයන්ගේ නිවන් මග වසාලමින් ශාසන විපස්සනා ප්‍රතිපදාවට කටුකොහොල් ඇද හෙලන විවිධ විපරීත දෘෂ්ටි මතුව ඇත. විශේෂයෙන්ම අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණ ධර්ම පිළිබඳව ථෙරවාදී ආචාර්ය පරම්පරාවෙන් රැගෙන ආ ශ්‍රී මුඛ බුද්ධ දේශනාවේ අර්ථ බිඳහෙලන විපරීත දෘෂ්ටි සමුදායක් මේ වන විට මතුව ඇත.

ත්‍රිපිටක පෙළ අර්ථකථා ටීකා ආදිය කියවා අර්ථ මතු කර ගැනීමට අපහසු ශාසනමාමක බොහෝ ගිහි පැවිදි පිරිස් එම විපරීත අර්ථයන් යොදාගෙන විපස්සනා භාවනා කිරීමට යාමෙන් තමන්ගේ මෝක්ෂ මාර්ගය ආවරණය කරගන්නේ ය. භාග්‍යවතුන් වහන්සේ වදාළ පරිදිම ගවකිරෙන් අර්ථ ඇතියෙක් දෙනකගේ අඟින් කොතරම් වීරිය යොදා දෙව්වද කිරි ලැබෙන්නේ නැත. එමෙන්ම කොපමණ වීරිය කළත් වැරදි අර්ථ යොදා ගනිමින් විපස්සනා කරන්නවුන්ට ලැබෙන මහඵලයක් නැත.

එබැවින් සද්ධර්මයාගේ චිරස්ථිතිය පිණිස ද සසුන් බඹසර හැසිරෙනවුන්ට අර්ථ පිණිස ද ලෝක සත්ත්වයාට නිවන්මග පාදා දෙනු පිණිස ද ථේරවාදීන්ට නිවැරදි ආචාර්යවාදය හඳුනා ගැනීම පිණිස ද ත්‍රිපිටක පෙළ අර්ථකථා ටීකා ආදියෙහි පැමිණි අර්ථ වලට අනුව අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණ ධර්මයන්ගේ අර්ථ පැවසීමට මෙම ලිපි පෙළ සකස් කරන ලදී.

මෙහි අන්තර්ගතය ලෙස ථෙරවාද අර්ථකතාවෙහි ත්‍රිලක්ෂණයන්ට දැක්වූ අර්ථ මොනවාදැයි යන්න ද, අනතුරුව අනිත්‍යතාවය පිළිබඳව සරල අදහසක් දක්වා ත්‍රිපිටක පාලියෙහි සූත්‍ර නිදර්ශන ද අර්ථකථා පාඨ නිදර්ශන ද ටීකා නිදර්ශන ද මෑත කාලීන බුරුම රට හා මෙරට භාවනා ආචාර්යවරුන්ගේ ඉගැන්වීම් ද දක්වමින් අනිත්‍යතාව පිළිබඳ අර්ථ පෙළ ගස්වා ඇත. ඉන් අනතුරුව දුක්ඛ අනාත්ම යන ලක්ෂණද්වය පිළිබඳව ද පෙළ අර්ථකථාවන්හි පැමිණි දහම් අරුත් දැක්වේ. ඊළඟට මෙම ත්‍රිලක්ෂණ අර්ථ අනුව විපස්සනාව වඩන ආකාරය භාග්‍යවතුන් වහන්සේ විසින් සූත්‍රවල දේශනා කරන ලද අයුරු පෙළ උදාහරණ සහිතව දැක්වේ. අනතුරුව මතු කරන ලද ත්‍රිලක්ෂණ අර්ථයන් සප්තවිශුද්ධිය තුළට බහා දක්වා ඇත. අවසාන වශයෙන් මතු කරන ලද ත්‍රිලකෂණ අර්ථ සතරමහාපදේශයන්ට බහා ශ්‍රී මුඛ බුද්ධ දේශනාව මෙයම බවට අර්ථ තහවුරු කර ඇත.

මෙම ලිපි පෙළ සකස් කරන ලද්දේ කලක් ධර්මය සමඟ ඇසුරක් පැවැත්වූවන්ට අර්ථ වැටහෙන පරිදිය. පුරන ලද පාරමී ඇති ඇතැම්හු තමන්ගේ ශාසනික ප්‍රතිපදාවේ මුල පටන්ම නිවැරදි ගැඹුරු දහම් අර්ථ වටහා ගෙන සුවසේ නිවැරදි මාවතේ ගමන යන්නේය. ඇතැමුන් විවිධ දහම් මත අධ්‍යයනය කරමින් තමන්ට වැටහෙන ලෙසින් අර්ථ දරාගෙන දුකසේ නිවැරදි මාවතේ ගමන යන්නේ ය. ඇතැමුන්ට කොතරම් කීවත් අර්ථ වටහා ගත නොහැකි හෙයින් සරල අර්ථ දරාගෙන වැරදි මාවතේ යන්නේ ය. එබැවින් මෙම ලිපි පෙළ පළමු පිරිසට දරාගත් අර්ථ වඩා ශක්තිමත් කර ගැනීමටත් දෙවන පිරිසට අර්ථ පිරිසිදු කර ගැනීමටත් සකසන ලදී.

එබැවින් දහම් අර්ථ දන්නෝ මෙය කියවා නොවැටහෙන අයට වටහා දෙත්වා. නොවැටහෙන්නෝ අර්ථ දතුවන්ගෙන් විමසා අර්ථ වටහා ගනිත්වා. අර්ථ වටහාගතුවෝ සෙස්සන්ට ද වටහා දෙත්වා. ත්‍රිපිටක පෙළ අර්ථකථා ටීකාවන්හි ආ මේ ක්‍රමයෙන් අර්ථ ගෙන තිලකුණු මෙනෙහි කොට විපස්සනාඥාන මුහුකුරුවා ගෙන සියලු සත්ත්වයෝ මහඵල නිවනින් සැනසෙත්වා.

-මහාවිහාරය-

# 1. අර්ථ කථාවන්හි පැමිණි ත්‍රිලක්ෂණ වචනාර්ථ

සියලු ලෝක සත්ත්වයා කෙරෙහි පතල මහා කරුණා ඇති තථාගත ශාන්තිනායකයාණන් වහන්සේ දහම් බෙර වයා ලෝ සත සනහා නිවන්පුර මංපෙත් විවරකර දී සියළු දුකින් මුදවා සියළු සංස්කාරයන්ගේ වැනසී යන ස්වභාවය ලෝ දනට පසක් කරවමින් අනුපාදිශේෂ නිර්වාණ ධාතුවෙන් පිරිනිවන් වැඩිසේක. ඒ ආජානෙයා මනුෂරත්නයාගේ ඖරස පුත්‍ර වූ මහා කාශ්‍යප මහරහතන්වහන්සේ ප්‍රමුඛ පන්සියයක් වූ සිව්පිළිසිඹියා පත් මහරහතන්වහන්සේලා ස්වකීය පීතෘන් වහන්සේගේ ඒ ධර්මචක්‍රය වැනසී නොයනු පිණිස සංගායනාවට නංවා පිරිනිවන් වැඩියහ.

ඉන් අනතුරුව ඒ ශ්‍රේෂ්ඨ ශාසන පරම්පරාවෙන් පැමිණි මේ ධර්මමාණික්‍ය රත්නය සබ්බකාමී සංඝ ශ්‍රේෂ්ඨයන්වහන්සේ ප්‍රමුඛ ඒ සුගතතථාගතයන්ගේම ධර්ම ලෙයින් ජාත වූ සත්සියයක් සිව්පිළිසිඹියාපත් මහරහතන්වහන්සේලා මැනවින් ඔපදමා බබුලුවා තබා තමන්වහන්සේලා ද පිරිනිවන් වැඩියාහුය.

එසේ බැබලූ ධර්මරත්නයේ රශ්මිධාරා වියැකෙන්නට නොදී මොග්ගලීපුත්තතිස්ස මහාසංඝරාජයාණෝ ප්‍රමුඛ සිව්පිළිසිඹියාපත් මහරහතන්වහන්සේලා දහස්නමක් එක්ව නැවතත් මෙරමුදුන සුදිලෙන සූර්ය මණ්ඩලය සේ බබලවා, ඒ රශ්මි මණ්ඩලයෙන් තව තවත් ලෝදන සැනහේවා යයි සිතා සිව් දිග දහම් බලසෙන් යවා බුද්ධරාජ්‍ය පුළුල් කොට වදාළාහුය. එගමන මෙසිරිලක වැඩි ඒ අනුබුද්ධ මහාමහේන්ද්‍ර මහාරහතන් වහන්සේ ප්‍රමුඛ ධර්ම දූතයෝ ඒ බුද්ධ ශ්‍රේෂ්ඨයන්වහන්සේගේ දහම් බෙරය ලක් පොළොව මත වයා වදාළාහුය. නොයෙක් වර සිරිලක්මහී තොමෝ සාධු ප්‍රීති ඝෝෂාවෙන් කම්පනය වෙමින් ඒ බුදුසසුන මේ මහපොළොවට භාරගත්තීය.

එතැන් පටන් වසර දෙදහස් තුන්සියයකට අධික කාලයක් ඒ මහාමහේන්ද්‍ර සඟරරජුන් පිහිටවූ ලක්දිව බුදුසසුන මහාඅරිට්ඨ ආදී මේ ධරණීතලයෙහි ජාත වූ මහාරහතන් වහන්සේලා විසින් රැගෙන අවුත් අද දක්වා ශේෂව පවතින්නේය.

සර්පවෙදකම නම් පරම්පරානුයාතව පැමිණියවුන් සන්තකයෙහිම මනාව පවතින්නේය. මන්ද යත් ඉපැරණි සර්ප වෙද්දු එහි මන්ත්‍ර ආදියත් ඖෂධ ආදියත් ඒවා මිශ්‍රකරන ක්‍රමවේදයත් මැනවින් දරාගෙන විත් මතුපරපුරට ලබාදුන් හෙයිනි. ඉදින් සර්ප වෙදකමින් අර්ථ ඇත්තා වූ යම් පුරුෂයෙක් සර්ප වෙදකම ඉගෙනීමට යා යුත්තේ ඒ වෙදපරපුරේ අද සිටින වෙදෙකු වෙතටය. එමෙන්ම ඒ බුද්ධ ශ්‍රේෂ්ඨයන්වහන්සේගේ ශාසනයේ යම්ම කරුණක් උකහා ගැනීමට කැමති නුවණැති කුලපුත්‍රයෝත් සෙවිය යුත්තේ ද ඒ පරපුරේම ජාත වූවෙක් ය. නොහොත් ඒ ඉපැරණි මහාවිහාරීය ථේරපරම්පරාවේ ආචාර්යවාද පිරිනොහෙලමින් දහම් අරුත් බහා තබා ඇති මිණිමංජුසාවන් බඳුවූ පෙළ අර්ථකථා ටීකා සංඛ්‍යාත ත්‍රිපිටක බුද්ධ වචනය තුළය.

අනිත්‍ය දුක්ඛ අනාත්ම යන මේ ත්‍රිලක්ෂණ ධර්මයෝ වනාහි සංස්කාරයන්ගේ යථාභූතස්වභාවය ගෙනහැර දක්වා සසර දුකින් එතරවනු රිසියන්ට තුන්ලෝක ධාතුවෙහිම වූ සියළු

සංස්කාරයන් කෙරෙහි කලකිරීම ඉපිදවීම පිණිස පෙනී සිටින ධර්මයෝ ය. මැනවින් සසරදුක් කෙළවර කරනු රිසි කුලපුත්‍රයන් විසින් මේ ත්‍රිලක්‍ෂණ ධර්මයෝ පිළිබඳව මනාව දතයුත්තාහ. එබැවින් එකී කුලපුතුන්ට සුවසේ ඒ අර්ථ වටහා ගැනීමට ත්‍රිපිටක පෙළ අටුවාවන්හි ආ ක්‍රමයෙන් ත්‍රිලක්‍ෂණ ධර්මයන්ගේ අර්ථ සැපයීමට මේ සටහන් පෙල තබන්නෙමු.

## ත්‍රිලක්‍ෂණයන්ගේ වචනාර්ථ

ත්‍රිලක්‍ෂණයන් යනු අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්‍ෂණයන්ය. හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත් සෑම ධර්මයක් ම ප්‍රධාන ලක්‍ෂණ දෙකකින් යුක්ත වේ.

1. පච්චත්ත ලක්ඛණ (පෞද්ගලික ලක්ෂණය)
2. සාමාන්‍ය ලක්ඛණ (පොදු ලක්ෂණය)

- මෙහි පච්චත්ත ලක්ෂණය යනු ලක්ඛණ, රස, පච්චුපට්ඨාන, පදට්ඨානාදී නයින් දේශිත ධාතුන්ගේ ලක්ෂණය, කෘත්‍ය හෙවත් රසය, වැටහෙන ආකාරය, එම ධර්මයට ආසන්න කාරණාව යන කරුණුය. උදාහරණ වශයෙන්,
    - පඨවිධාතුව
        - කක්ඛලත්ත ලක්ඛණා (කර්කශභාවය ලක්ෂණය යි)
        - පතිට්ඨාන රසා (අන් ධාතුන්ට පිහිටීමට ආධාර වන බව කෘත්‍ය රසය යි)
        - සම්පටිච්ඡන පච්චුපට්ඨානා (අන් ධාතුන් පිළිගන්නා බව වැටහෙන ආකාරය යි)
        - සෙසත්තය පදට්ඨානා (සෙසු ධාතු තුන එනම් ආපෝ තේජෝ වායෝ ආසන්න කාරණාව යි.)

    මේ ආකාරයට එකම ධාතුවේ විවිධ ගුණාංග දැක්වීම පච්චත්ත ලක්‍ෂණය වේ.

- මෙහි සාමාන්‍ය ලක්‍ෂණය යනු සියළුම සංඛත ධර්මයන්ගේ පොදු ලක්ෂණයි. ඒවා නම් ඉහත කියන ලද අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ලක්‍ෂණත්‍රය යි. එබැවින් භාග්‍යවතුන් වහන්සේ වදාළේමැයි,

I. **''සබ්බෙ සඞ්ඛාරා අනිච්චා'ති – යදා පඤ්ඤාය පස්සති**

**අථ නිබ්බින්දති දුක්ඛෙ – එස මග්ගො විසුද්ධියා.''**

[සියලු සංස්කාරයෝ අනිත්‍යයහ යි යම් කලෙක විදසුන් නුවණින් දක්නේ ද එ කල්හි මේ (ස්කන්ධපරිහරණය යැයි කියන ලද) දුකෙහි (මුදුන් පත් වුට්ඨානගාමිනීවිපස්සනා වශයෙන්) කළකිරෙන්නේ ය. (එසේ කලකිරුණේ දුඃඛපරිඥානාදි විසින් සත්‍යප්‍රතිවෙධය කරන්නේ ය. එ හෙයින්) මේ සංස්කාරයන් කෙරෙහි නිර්වෙදය, නිර්මල වීමට (නොහොත් නිවනට) මඟ ය.]

**II.** **''සබ්බෙ සඞ්ඛාරා දුක්ඛා'ති – යදා පඤ්ඤාය පස්සති**

**අථ නිබ්බින්දති දුක්ඛෙ – එස මග්ගො විසුද්ධියා.''**

[සියලු සංස්කාරයෝ (උදයව්‍යයයෙන් පෙළෙන හෙයින්) දුක්හ යි යම් කලෙක විදසුන් නුවණින් දකී ද, එකලැ මේ ස්කන්ධ පරිහරණයෙහි (දුකෙහි) කළකිරෙන්නේ ය. (එසේ කලකිරුණේ සත්‍යයන් පිළිවිදුනේ ය.) මේ සංස්කාරයන් කෙරෙහි කළකිරීම, නිර්මල බවට (නොහොත් නිවනට) මඟය (කාරණ ය).]

**III.** **''සබ්බෙ ධම්මා අනත්තා'ති – යදා පඤ්ඤාය පස්සති**

**අථ නිබ්බින්දති දුක්ඛෙ – එස මග්ගො විසුද්ධියා.''**

[සියලු පස් කඳහු (තමා වසයෙහි නොපවත්නා හෙයින්) අනාත්මහ යි යම් කලෙක විදසුන් නුවණින් දක්නේ ද, එ කල්හි මේ දුකෙහි (ස්කන්ධපරිහරණයෙහි) කළකිරෙන්නේ ය. (එසේ කළකිරුනේ සත්‍යප්‍රතිවෙධය කරන්නේ ය.) එහෙයින් මේ සංස්කාරයන්හි කලකිරීම, නිර්මල බවට (නොහොත් නිවනට) මඟ ය. ( ධම්මපදපාළි මග්ග වග්ගය - බු.ජ.මු පි.94 )]

මෙකී ත්‍රිලක්ෂණයන්ගේ පදගතාර්ථය අර්ථකථාවන්හි මෙසේ දැක්වේ.

- අනිත්‍ය ලක්ෂණය

**“තං හි හුත්වා අභාවට්ඨෙන අනිච්චං, අනිච්චන්ති කතාය ආදිඅන්තවන්තතාය වා අනිච්චං”** (පටිසම්භිදාමග්ග අ.ක. - සම්මස්සන ඤාණනිද්දෙස වණ්ණනා - හේ.මු. 177)

“ඒ රූපාරූප ධර්මයෝ ඉපිද අභාවයට යන අරුතින් අනිච්චං ය. යීති ක්‍ෂණයට පැමිණියහුගේ අනිත්‍යතාව ඇති බැවින් හෝ උප්පාද වය සංඛ්‍යාත ආදියකින් අන්තයකින් යුක්ත බැවින් හෝ අනිච්චං ය.”

- දුක්ඛ ලක්ෂණය

**“දුක්ඛයතීති දුක්ඛං, යස්සුප්පජ්ජති තං දුක්ඛිතං කරෝතීති අත්ථො”** (පටිසම්භිදාමග්ග අ.ක. - අභිඤ්ඤෙය්‍ය නිද්දේසවණ්ණනා - හේ.මු. 55)

“දුක් කරවන්නේහු යි දුක්ඛං වේ. යමෙකුට උපදියි ද ඔහු දුක්ඛිතයෙකු කරයි යන අර්ථය යි.”

- අනාත්ම ලක්ෂණය

**“අත්තනි වසීකාරකො වෙදකො සයංවසීති එවං පරිකප්පිතස්ස අත්තසාරස්ස අභාවෙන අනත්තා”** (පටිසම්භිදාමග්ග අ.ක. - ලක්ඛණත්තික නිද්දෙසවණ්ණනා - හේ.මු. 99)

“තමා කෙරෙහි වූ වශීකාරකයෙක් විඳින්නෙක් මැඩපවත්වන්නෙක් ඇත්තේය යන මෙසේ වූ පරිකල්පිත ආත්මසාරයකගේ අභාවයෙන් අනත්තා නම් වේ.”

ත්‍රිලක්ෂණය පිළිබඳ ථේරවාදී අර්ථ කථාවන්හි මෙසේ සැකෙවින් දක්වා ඇති අර්ථය වඩාත් ගැඹුරින් ත්‍රිපිටකයෙහි විස්තර වේ.

**එහෙයින් ඒ ගම්භීර වූ විස්තරාත්මක අර්ථ වර්ණනාව යථා ශක්තියෙන් මීළඟ ලිපිවලින් විස්තර කරන්නෙමු.**

## 2. අනිත්‍යය පිළිබඳව දතයුතු කරුණු

**පසුගිය ලිපියෙන් අපි ත්‍රිලක්ෂණයන් සඳහා අර්ථකථාවන්හි පැමිණි වචනාර්ථ විස්තර කළෙමු. අද ලිපියෙන් සැබවින්ම අනිත්‍ය වන්නේ මොනවා ද, අනිත්‍යතාවය පිළිබඳව ත්‍රිපිටක පාළියෙහි අර්ථ දක්වා ඇත්තේ කෙසේදැයි විස්තර කරන්නෙමු.**

ලෝක ව්‍යවහාරය තුළ සාමාන්‍ය සම්මුති වස්තු වල විනාශවීමට වෙනස්වීමට ප්‍රකෘති ස්වභාවය අත්හැරීමට ද අනිත්‍ය වේ යැයි කියනු ලැබේ. ඒ අනිත්‍යභාවය නම් වයසට යාමය කෙස් සුදුවීමය හම රැලි වැටීමය ගස් කොළ විනාශවී යාමය යනාදී වශයෙන් කියනු ලබන සිදුවීම් වලින් ප්‍රකාශයට පත් වේ.

නමුදු සැබවින්ම ධර්මයේ සඳහන් වන විපස්සනා භාවනාවේදී කියනු ලබන අනිත්‍යභාවය ඊට වඩා මහත් ගැඹුරකින් වූ අර්ථ ප්‍රකාශයකි. එම අනිත්‍යභාවය දැනගැනීමට පෙර සැබවින්ම අනිත්‍ය වන්නේ මොනවාදැයි සොයා බැලිය යුතුය. එය මෙසේ ය.

ලෝකයේ ප්‍රධාන වශයෙන් සත්‍ය දෙකක් ඇත්තාහ. එනම් සම්මුති සත්‍ය හා පරමාර්ථ සත්‍ය යනුවෙනි. ඒ සත්‍යයන් පිළිබඳව මෙසේ දැක්විය හැක.

- සම්මුති සත්‍ය

ලෝකයේ සාමාන්‍ය ව්‍යවහාරයේ පරිදි ඇත්තා සේ සලකන මව් පිය දරු ඥාති හිතමිත්‍රාදීන් සත්තු ගහ කොළ ගංගා ඇල දොල ඉර හඳ යනාදීන්ගෙන් සැදුම් ලත් මෙම ලෝකයට සම්මුති ලෝකය යයි කියනු ලැබේ. ඒ ලෝකය තුළ ජීවත්වන අපි ලෝක සම්මතයන්ට අනුව ආචාර ධර්ම පද්ධති සකසා ගෙන සමාජ සම්බන්ධතා ගොඩනගා ගෙන ආර්ථික සාමාජයීය දේශපාලනික වශයෙන් ජීවත් වෙමු. මේ ආකාරයට ඇත්තා වූ ලෝකය, සමාජය වැටහෙන ආකාරයෙන් ඇතැයි කියා පිළිගැනීම සම්මුති සත්‍ය වේ.

- පරමාර්ථ සත්‍ය

ඉහත කී සියලු ලෝක ව්‍යවහාර උපදිනුයේ යම් පරමාර්ථ ධර්ම සමූහයක් අරඹයාය. එකී පරමාර්ථ ධර්මයෝ නම් ලෝකය තුළ සැබැවින් ම විද්‍යාමානවන්නා වූ පඨවි ආපෝ තේජෝ වායෝ ආදී රූප ධර්මත් වේදනා සංඥා චේතනා විඤ්ඤාණ යනාදී නාම ධර්මත් අසංඛත නිර්වාණ ධාතුවත් යන ධර්මයෝ ය. සැබැවින්ම මෙයින් නිර්වාණ ධාතුව යනු සතර මග සතර ඵලාදී ඥානයන්ගෙන්ම දත යුතු වූ ධර්මයකි. සෙසු නාම රූප ධර්මයෝම අපට මව්පිය දූ දරු ගහ කොළ සතා සිව්පාවුන් ලෙසට වැටහෙන්නෝය. සැබැවින් විද්‍යාමාන ලෙසින් ඇත්තේ පරමාර්ථ ධර්මයෝම නිසාත් ඒ පරමාර්ථ ධර්ම නිසාම ගහකොළ සතා සිව්පාවුන් සහිත ලෝකයක් ඇත්තා සේ වැටහෙන නිසාත් ඒ පරමාර්ථ ධර්මයන්ටම "පරමාර්ථ සත්‍ය" යයි කියනු ලැබේ. ඒ පරමාර්ථ තත්ත්වය නුවණින් ස්පර්ශ කරමින්

ජීවත්වන කල්‍යාණ පෘථග්ජනයෙකුට හෝ ආර්ය උත්තමයෙකුටම පරමාර්ථ සත්‍ය දන්නෙක් යැයි කියනු ලැබේ. මේ සටහන් පෙළ ත්‍රිලක්ෂණ ධර්මයන් ගැන පැවසීමට සකස් කරන්නක් බැවින් මෙයින් ගැඹුරට පරමාර්ථ ධර්ම පිළිබඳව කරුණු පැහැදිලි කිරීමට අපේක්ෂා නොකරන්නෙමු.

සැබැවින්ම අනිත්‍යවන්නේ මොනවාදැයි පෙර නැගූ ප්‍රශ්නයට පිළිතුර වනුයේ සැබැවින්ම අනිත්‍ය වන්නේ හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා සංඛත පරමාර්ථයෝය යන්නයි.

ලෝකයාට වයසට යාමය, කෙස් සුදුවීමය හමරැලි වැටීමය ගහකොළ විනාශ වීමය යනුවෙන් වැටහෙනුයේ ඉහත කී නාම රූප ධර්ම පරම්පරා යම් කලක් තුළ පැවතී නැතිවී යාමය. නමුත් පරමාර්ථ ධර්මයෝ නම් ඉතා දුර්වලයෝය. ඔවුන්ට ඉපිද මහ වේලාවක් පැවතීමට නුපුළුවන. පරමාර්ථයෝ නම් ලක්ෂණ මාත්‍රයම දැක්වීම් වශයෙන් ඉපිද වහා නිරුද්ධ වන ස්වභාව ඇත්තෝය. එයිනුත් සිත යන ධර්මය රූපයටත් වඩා අඩු ආයුෂයකින් විනාශ වී යන්නාහ. රූපය සිතේ ආයුෂය මෙන් දහහත් ගුණයක කාලයක් පමණක් පවතින්නකි. එක් රූප පරම්පරාවක අසුරු සැණක කාලයක් තුලදී රූප ලක්‍ෂ ගණනින් එකිනෙකට පසුව පසුව ඉපිද ඉපිද බිඳි බිඳී යන්නේය. පරමාර්ථයන්ගේ ඇති මේ වහා පෙරලෙන ස්වභාව ද ඉපිද බිඳෙන ස්වභාවද භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

- **''නාහං, භික්ඛවෙ, අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යං එවං ලහුපරිවත්තං යථයිදං චිත්තං යාවඤ්චිදං භික්ඛවෙ, උපමාපි න සුකරා යාව ලහුපරිවත්තං චිත්ත'න්ති.**

මහණෙනි, යමෙක් මෙසේ වහා ඉපිද නස්නා සුලු වේ නම්, සිත බඳු අන් එක ධර්මයකුදු මම නො දක්මි. මහණෙනි, සිත අත්‍යර්ථයෙන් වහා පෙරළෙන සුලු වේ නම්, එයට උපමාවකුදු අතිශය දුෂ්කර වේ. (අංගුත්තර නිකාය 1 - ඒකක නිපාතය - බු.ජ.මු.18)

- **තීණිමානි, භික්ඛවෙ, සඞ්ඛතස්ස සඞ්ඛතලක්ඛණානි. කතමානි තීණි? උප්පාදො පඤ්ඤායති, වයො පඤ්ඤායති, ඨිතස්ස අඤ්ඤථත්තං පඤ්ඤායති. ඉමානි ඛො, භික්ඛවෙ, තීණි සඞ්ඛතස්ස සඞ්ඛතලක්ඛණානී''ති .**

මහණෙනි, ප්‍රත්‍යය සමවායයෙන් සකස් කරණ ලද්දහුගේ මේ සඞ්ඛත ලක්‍ෂණ තුණෙකි. කවර තුණෙක යත්: ඉපැදීම පැණෙයි, නැස්ම (බිඳීම) පැණෙයි, සිටියහුගේ වෙනස්වීම (නම් වූ ජරාව) පැණෙයි. මහණෙනි, ප්‍රත්‍යය සමවායයෙන් සකස් කරණ ලද්දහුගේ මේ සඞ්ඛත ලක්‍ෂණ තුණයි. (අඞ්ගුත්තරනිකාය 1 - තිකනිපාතපාළි - බු.ජ.මු. පි.274)

තවද භාග්‍යවතුන් වහන්සේ ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා සියලුම සඞ්ඛත ධර්මයන්ගේ සඞ්ඛත ලක්ෂණය දේශනා කරනුයේ සෑම සඞ්ඛතයක්ම ඉපිද නිරුද්ධ වන බව දේශනා කළ සේක.

ඉදින් ලෝකය තුළ අසුර සැණෙක කාලයක් තුලදී එකිනෙකට පසුව ලක්‍ෂවාර කෝටිවාර ගණනක් ඉපිද ඉපිද බිඳි බිඳී යන්නා වූ මනුෂ්‍යයන්ට අරමුණු කළ හැකි දෙයක් වූයේ වී නම් භාග්‍යවතුන්

වහන්සේ එය මෙහිදී උපමාව ලෙස දක්වන්නේ ය. නමුදු මේ පරමාර්ථයන්ගේ වහ වහා ඉපිද ඉපිද බිඳි බිඳී යන ස්වභාවය නිසාම භාග්‍යවතුන් වහන්සේ උපමාවක් ඉදිරිපත් නොකරන ලද සේක. එබැවින් පරමාර්ථයන්ගේ ඇති මේ ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා ඉපිද ඉපිද බිඳි බිඳී යන ස්වභාවය භාග්‍යවතුන් වහන්සේගේ ශ්‍රී මුඛයෙන් දේශනා කරන ලද්දක් බව නුවණැතියෝ වටහා ගත යුත්තාහ.

නුවණැත්තෝ නම් උපමාවෙනුදු කරුණු දැනගන්නා සුල්ලෝය. පරමාර්ථයන්ගේ වන මේ ක්‍ෂණික ඉපිද බිඳී යාම අනුමාන ඥාණයෙන් දැනගැනීමට මෙලෙස උපමාවක් දැක්විය හැක.

යමෙක් "බුද්ධං සරණං ගච්ඡාමී" යන වාක්‍ය කියනු ලබන විට හෙතෙමේ 'බු' කාරයට අනතුරුව 'ද්' කාරය ද ඉන් අනතුරුව 'ධ' කාරය ද ආදී වශයෙන් උසුරුවන්නේය. එවිට 'ද්' කාරයේ ශබ්දය උපදින විට ඔහුගේ මුවින් නිකුත් වූ 'බු' කාර ශබ්දය නිරුද්ධ බව ද 'ධ' කාරයේ ශබ්දය උපදින විට 'ද් කාරයේ ශබ්දය නිරුද්ධ බව ද යනාදී වශයෙන් ඉදිරි ඉදිරි අක්‍ෂරයට අදාල ශබ්දය පිටවන විට පළමු පළමු අක්‍ෂරයට අදාල ශබ්දය නැතිවී ගොස් ඇති බව ද මනාව පරීක්‍ෂා කරන්නෙකුට වැටහෙන්නේය. මේ අනුව බලන විට සෑම ශබ්දයක් ම උපදින විට පූර්ව ශබ්ද නිරුද්ධ වී ඇති බවත් පසු පසු ශබ්ද ඉපිද නැති බවත් වැටහෙන්නේ නම් එකී නුවණැතියාට මේ ශබ්ද රූපයාගේ පරම්පරා වශයෙන් ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා ඉපිද නිරුද්ධ වන බව මොනවට වැටහෙන්නේය. උපදින ශබ්ද රූපය පෙර කොහේවත් සැඟවී නොසිට ඒ මොහොතේම ප්‍රත්‍ය සමවායෙන් ඉපිද, නිරුද්ධ වීමෙන් පසුව කොහේ හෝ සැඟවී නොගොස් යලිදු නූපදින පරිදි බිඳී ගිය බව යමෙකුගේ තියුණු නුවණට අරමුණු වේ නම් "බුද්ධ දේශනාවේ විපස්සනා කථාවට අදාල අනිත්‍යතාව" හෙතෙමේ වටහාගත්තේ යයි කිව හැක.

අනිත්‍යතාව වටහා ගැනීමට මේ සුළු උපමාව ඉදිරිපත් කළේ නමුදු විපස්සනාවේ දී මෙම පියවර සාර්ථක කරගැනීමට පෙරාතුව යෝගාවචරයා විසින් අනිවාර්යයෙන් නාම රූප පරිග්‍රහණය සහ ප්‍රත්‍ය පරිග්‍රහණය අවසන් කොට තිබිය යුතුය. ඒ ඥානයෙන් පූරණය නොකොට නාමරූපයෝ පෙර නොතිබීම ප්‍රත්‍යසමවායෙන් හටගන්නා බව වටහා ගත හැකිය යන කාරණය සිදුනොවන්නකි. මේ සටහන් පෙළ ත්‍රිලක්‍ෂණය පිළිබඳව හෙයින් ඒ කරුණු මෙහි සඳහන් කිරීමට අපේක්‍ෂා නොකරමු.

## නාමරූපයන්ගේ ක්‍ෂණික නිරෝධය පිළිබඳ තවත් ත්‍රිපිටක නිදර්ශන

- **"අනිච්චා වත සඞ්ඛාරා - උප්පාදවයධම්මිනො**

  **උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති - තෙසං වූපසමො සුඛො"ති.**

[පසයෙන් හටගත් සියලු දෑ ඒකාන්තයෙන් ඉපැදෙන වැනැසෙන සුලු ය. ඔහු ඉපැද නැසෙත්. ඔවුන්ගේ සංසිඳීම සුව ගෙන දෙයි. ( දීඝ නිකාය 02 , මහා පරිනිර්වාණ සූත්‍රය - බු.ජ.මු පි.246 )]

මහාපරිනිර්වාණ සූත්‍රයෙහි එන භාග්‍යවතුන් වහන්සේ පිරිනිවිකල්හි සක්දෙව් රජු විසින් කියූ මේ ගාථාවද සංඛත ධර්මයන්ගේ ස්වභාවයට නිදර්ශණයකි. මේ ගාථාවේ ද "උප්පාදවයධම්මිනො" යන පදයෙන් ඉපිද නැසෙන බව මොනවට මතු කරයි. ඒ අර්ථයාගේ දැඩි කිරීම පිණිස මතු ද "උප්පජ්ජිත්වා නිරුජ්ඣන්ති" යනුවෙන් ප්‍රකාශ කළේය. මේ දීඝනිකයෙහි නිදසුනින් ද සංඛත ධර්මයාගේ වහ වහා ඉපිද බිඳෙන බව බුදු වදනක් බවට තහවුරු කරයි.

තවද පටිසම්භිදාමග්ගප්පකරණය දේශනා කරන ධර්මසේනාධිපති සාරිපුත්ත මහරහතන් වහන්සේ භාග්‍යවතුන් වහන්සේ වදාළ චිත්තයාගේ ලහුපරිවර්තක භාවයෙහි අර්ථය තීව්‍ර කරමින් එනම් මේ කෙබඳු ලහුපරිවර්තක භාවයක් දැයි දක්වමින් මෙසේ දේශනා කොට වදාළ සේක.

- **"රූපාරම්මණතා චිත්තං උප්පජ්ජිත්වා භිජ්ජති. තං ආරම්මණං පටිසඞ්ඛා තස්ස චිත්තස්ස භඞ්ගං අනුපස්සති."**

[රූපය අරමුණු කොට සිත ඉපැද බිඳෙයි. ඒ අරමුණ ප්‍රත්‍යවෙක්‍ෂා කොට ඒ චිත්තයාගේ භඞ්ගය (අපරචිත්තයෙන්) පුනපුනා දකියි. (පටිසම්භිදාමග්ගප්පකරණය 1 - මහාවග්ගය - ඥානකථා - බු.ජ.මු. 108)]

භාග්‍යවතුන් වහන්සේ වදාළ උපමාවකිනිදු ප්‍රකට කළ නොහැකි චිත්තයාගේ අතිසීඝ්‍ර ලහුපරිවත්තක භාවය නම් ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා ඉපදීම් බිඳීම් වලින් වන ලහුපරිවර්තක භාවයක් බව බුද්ධමතඥ ධර්මසේනාධිපතීන් වහන්සේ මෙසේ දේශනා කොට වදාළ සේක.

තවද සියලු රූපයන්ගේ පොදු ලක්‍ෂණයක් වූ ද විද්‍යාමාන පරමාර්ථයක් නොවූද සියළු රූපයන්ගේ බිඳීම් ලක්‍ෂණය වූ අනිච්චතා රූපය පිළිබඳව දක්වන ධම්මසංගණීපකරණ පාඨයෙන් ද රූපධර්මයන්ගේ ක්‍ෂණික බිඳීම පිළිබඳව මෙසේ දක්වයි.

- **"කතමං තං රූපං රූපස්ස අනිච්චතා? යො රූපස්ස ඛයො වයො භෙදො පරිභෙදො අනිච්චතා අන්තරධානං – ඉදං තං රූපං රූපස්ස අනිච්චතා. "**

[ඒ රූපයාගේ අනිච්චතා රූපය කවරේ යත්: රූපයාගේ යම් ක්ෂය වීමෙක් විනාශයෙක් බිඳීමෙක් පරිභෙදයෙක් අනිත්‍යතායෙක් අතුරුදහන් වීමෙක් වේ ද, මේ ඒ රූපයාගේ අනිත්‍යතා රූප යි. (ධම්මසංගණීපකරණය - රූප කාණ්ඩය - බු.ජ.මු. 302)]

මේ ධම්මසංගණීප්‍රකරණ පාඨයෙන් ද උපන් රූපයාගේ විනාශවීම, බිඳීයාම අතුරුදහන්වීම යන පාඨයන්ගෙන් අනිත්‍යතාවය දැක්වීමෙන් ද බිඳෙන්නා වූ රූප ධර්මයෝ කිසිතැනක නොසැඟවී නිරවශේෂව නිරුද්ධ වී යන බව ප්‍රකාශිතය. මෙයින් ද සංඛත ධර්මයන්ගේ අනිත්‍යතාවය යනු ඉපිද බිඳීයාම බව වටහාගතයුත්තාහ. මෙබඳු උදාහරණ සූත්‍ර පාඨ ත්‍රිපිටක පාලිය පුරාවට බොහෝ සූත්‍රවල සඳහන් වේ. මෙකී ශ්‍රී මුඛ බුද්ධ දේශනා නිදසුන් වලට අනුව අනිත්‍යතාව යනු තෙල අරුතම බව පැහැදිලිය.

තවද කථාවත්ථුපකරණයෙහි "එකම සිතක් බොහෝ කල් පවතී" යන පරවාදය බිඳීම පිණිස දක්වන ලද "චිත්තට්ඨිති කථා" කොටසෙහි මෙසේ සඳහන් වෙයි.

- **ප.පු: ආකාසානඤ්චායතනූපගානං දෙවානං චිත්තං මුහුත්තං මුහුත්තං උප්පජ්ජති, මුහුත්තං මුහුත්තං නිරුජ්ඣතීති?**
  **ස.පටිඤ්ඤා: ආමන්තා.**

[ප.පු: ආකාසානඤ්චායතනූපග දෙවියන්ගේ සිත මොහොතක් පාසා උපදීද? මොහොතක් පාසා නිරුද්ධ වේද?
ස.පටිඤ්ඤා: එසේ යැ (කථාවත්ථුපකරණය I - චිත්තට්ඨිති කථා - බු.ජ.මු. 530)]

මෙහිදී මොග්ගලීපුත්තතිස්ස හිමි පරවාදියාගේ පැනයට, "අනිච්චා වත සංඛාරා" ගාථාවෙහි එන "උප්පාද වය ධම්මිනෝ සූත්‍ර පාඨය සලකාගෙන සිත මොහොතක් මොහොතක් පාසා ඉපිද නිරුද්ධ වන බව පිළිගත් සේක. එබැවින් කථාවත්ථුපකරණයහි එන මෙම පාඨයෙන්ද සිත මොහොතක් මොහොතක් පාසා ඉපිද නිරුද්ධ වන බව දැක්වෙයි.

**මීළඟ ලිපියෙන් අනිත්‍යතාවය යන්නට අර්ථකථාවන් තුළ අර්ථ දක්වා ඇත්තේ කෙසේදැයි විස්තර කරන්නෙමු.**

## 3. නාමරූපයන්ගේ ක්‍ෂණික නිරෝධය පිළිබඳව අර්ථකථා සාධක පාඨ

**පසුගිය ලිපියෙන් අපි අනිත්‍යතාවය යනු කුමක්ද, ඒ සඳහා ත්‍රිපිටක පාළියෙහි අර්ථ දක්වා ඇත්තේ කෙසේදැයි විස්තර කළෙමු. මෙම ලිපියෙන් අර්ථකථාවන් හා ටීකාවන් තුළ අනිත්‍යතාවය සඳහා අර්ථකථනයන් දක්වා ඇත්තේ කෙසේදැයි විස්තර කරන්නෙමු.**

නාමරූප සංඛ්‍යාත ලෝකය කෙරෙහි සත්වයා තුළ තිබෙන ආලය දුරුකිරීමට නම් ඒ ධර්මයන්ගේ යථා ස්වභාවය සම්‍යක් ප්‍රඥාවෙන් දත යුතුය. යමෙක් සංස්කාරයන්ගේ ඉපිද බිඳී යාම දකින්නේ නම් තමාගේ පැවැත්මවත් රැක ගත නොහැකි මේ සංස්කාර ධර්මයන්ගෙන් ස්ථිර සැපයක් පිළිසරණක් ලබාගත නොහැකි බව අවබෝධවීමෙන් සංස්කාරලෝකය කෙරෙහි කලකිරීම උපදින්නේය. ඒ කලකිරීම ඒ පුද්ගලයාට සංස්කාරයන්ගේ නොපිහිටීම නම් වූ නිර්වාණය අරමුණු කිරීමට සෘජුව හේතු වන්නේය. එම නිසා අර්ථකථාවන්හිද මේ සංඛාරයන්ගේ ඉපිද බිඳී යාමේ අනිත්‍යතාව ලෙස මෙසේ දක්වා ඇත.

### I. අලගද්දූපම සූත්‍ර අර්ථකථාව

- **“අනිච්චං භන්තෙති භන්තෙ යස්මා හුත්‍වා න හෝති. තස්මා අනිච්චං. උප්පාද-වයත්ත-තාවකාලික - නිච්චපටික්ඛෙපට්ඨෙන චාති චතූහි කාරණෙහි අනිච්චං.”**

[අනිච්චං භන්තෙ යනු වහන්ස යම්හෙයකින් රූපාදී ස්කන්ධයෝ ඇතිවී නැතිවී යයි ද එබැවින් අනිත්‍යය ය. ඉපදීම - විනාශවීම - තාවකාලික බව - නිත්‍යභාවය ප්‍රතික්ෂේප කරන අර්ථය යන සිව් කාරණයන්ගෙන් අනිත්‍ය ය.(මජ්.නිකාය අට්ඨකථා II - අලගද්දූපම සුත්ත වණ්ණනා - හේමු. 93 )]

අලගද්දූපම සූත්‍ර අර්ථකථාවෙහි දී රැස්ව සිටි සඟ පිරිසගෙන් භාග්‍යවතුන් වහන්සේ “මහණෙනි, රූපය නිත්‍යවේදැයි” නැගූ ප්‍රශ්නයට සඟ පිරිසෙන් ලැබූ “අනිච්චං භන්තෙ” යන පිළිතුර විස්තර කරමින් ඉහත පාඨය සඳහන් කරන ලදී. එහි ඉපිද බිඳෙන හෙයින් ද උප්පාද වය ලක්‍ෂණයන්ගෙන් යුක්ත හෙයින් ද අනිත්‍ය යි යනුවෙන් බුද්ධමතඥ මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ප්‍රමුඛ පන්සියයක් චතුපටිසම්භිදාලාභී මහරහතන් වහන්සේලා අර්ථ තැබූහ.

## II. මහානිදාන සූත්‍ර අර්ථකථාව

තවද දීඝනිකායේ මහානිදාන සූත්‍රයට අර්ථ සපයා අර්ථකථාචාරීන්වහන්සේලා මෙසේ දක්වයි.

- **"අනිච්චාදීසු හුත්වා අභාවතො අනිච්චා. තෙහි තෙහි කාරණෙහි සඞ්ගම්ම සමාගම්ම කතාති සඞ්ඛතා. තං තං පච්චයං පටිච්ච සම්මා කාරණෙනෙව උප්පන්නාති පටිච්චසමුප්පන්නා. ඛයොතිආදි සබ්බං භඞ්ගස්ස වෙවචනං. යං හි භිජ්ජති, තං ඛීයතිපි වයතිපි විරජ්ජතිපි නිරුජ්ඣතිපි, තස්මා ඛයධම්මාතිආදි වුත්තං."**

[අනිච්ච ආදීන්හි ඉපිද අභාවයට පත්වන බැවින් 'අනිච්චා' ය. ඒ ඒ කාරණයන් එක්ව රැස්ව කරන ලද්දේනුයි. 'සංඛතා' ය. ඒ ඒ ප්‍රත්‍යය හේතුවෙන් නිවැරදි කාරණයන්ගෙන්ම උපන්නේනුයි 'පටිච්චසමුප්පන්නා' ය. 'ඛයො' යන ආදී සියල්ල සංඛත ධර්මයන්ගේ 'භංගයාගේ - බිඳීයාමේ ගුණයට සමාන අර්ථ හඟවන පදයෝ ය. යමක් වනාහි බිඳෙයි ද එය ක්‍ෂයභාවයට ද විනාශභාවයටද බිඳී කොහි හෝ සැඟව නොයනභාවයට ද බිඳීයනුයේ නැවත නොඑනභාවයට ද යයි. එබැවින් 'ඛයධම්මො' යන ආදිය කියන ලදී. (දීඝනිකායට්ඨකථා I - මහානිදානසුත්තවණ්ණනා - හේ.මු.347)]

මේ අර්ථකථා පාඨයෙන් ද නාමරූපයන්ගේ පෙර නොතිබීම ඉපිද ඉතිරි නැතිව බිඳී යන බවම අනිච්චතාවය ලෙසට අර්ථ තහවුරු කරයි.

## III. විශුද්ධ මාර්ගය

එසේම ථේරවාදී ග්‍රන්ථයන් අතුරෙහි ඉහළින්ම වැජඹෙන, බුද්ධඝෝෂාචාර්යන් වහන්සේ විසින් රචනා කරන ලද 'විශුද්ධ මාර්ග' අර්ථකථාවෙහි ද නාමරූපයන්ගේ ඉපිද බිඳීයාම පිළිබඳව මෙසේ දක්වා ඇත.

- **"ඉමස්ස නාමරූපස්ස උප්පත්තිතො පුබ්බෙ අනුප්පන්නස්ස රාසි වා නිචයො වා නත්ථි, උප්පජ්ජමානස්සාපි රාසිතො වා නිචයතො වා ආගමනං නාම නත්ථි, නිරුජ්ඣමානස්සාපි දිසාවිදිසාගමනං නාම නත්ථි, නිරුද්ධස්සාපි එකස්මිං ඨානෙ රාසිතො නිචයතො නිධානතො අවට්ඨානං නාම නත්ථි. යථා පන වීණාය වාදියමානාය උප්පන්නස්ස සද්දස්ස නෙව උප්පත්තිතො පුබ්බෙ සන්නිචයො අත්ථි, න උප්පජ්ජමානො සන්නිචයතො ආගතො, න නිරුජ්ඣමානස්ස දිසාවිදිසාගමනං අත්ථි, න නිරුද්ධො කත්ථචි සන්නිචිතො තිට්ඨති, අථ ඛො වීණඤ්ච උපවීණඤ්ච පුරිසස්ස ච තජ්ජං වායාමං පටිච්ච අහුත්වා සම්භොති, හුත්වා පතිවෙති. එවං සබ්බෙපි රූපාරූපිනො ධම්මා අහුත්වා සම්භොන්ති, හුත්වා පතිවෙන්තී"ති**

[මේ නූපන් නාමරූපයාගේ ඉපදීමට පෙර රාශියක් හෝ රැස්වීතිබීමක් හෝ නැත. මේ නාම රූපයන් ඉපදෙනුයේ ද රාශියකින් හෝ රැස්වීතිබුතැනකින් පැමිණීමක් නැත. මේ නාමරූපයන් නිරුද්ධවනුයේ ද ඒ ඒ දිශාවන්ට ගමන් කිරීමක් නැත. මේ නාමරූපයන් නිරුද්ධ වූයේ ද එක් ස්ථානයෙක්හි රාශිවීම් වශයෙන් රැස්වීම් වශයෙන් නිධන්වීම් වශයෙන් සිටීමක් නැත.යම්සේ වනාහි වීණාව වාදනය කරනුයේ

උපන් ශබ්දයට උත්පත්තියට පෙර රැස්වීමක් නැත්මය. උපදිනුයේ ද රැස්වී තිබූ තැනකින් ආවේද නොවේ. නිරුද්ධවනුයේ ද ඒ ඒ දිශාවට ගමන් කිරීමක් නැත. නිරුද්ධ වූයේ ද කිසියම් තැනෙක්හි රැස්වීම් වශයෙන් ද නොසිටියි. එතකුදු වුවත් වීණාවද වීණාදඬුව ද වාදක පුරුෂයාගේ වෑයම ද නිසා වීණා නාදය නොතිබීම හටගනී. ඉපිද විනාශ වෙයි. මෙසේ සියළු රූපාරූප ධර්මයෝ ද නොතිබීම හටගනිත්. ඉපිද නැසෙත් (විශුද්ධි මාර්ගය - මග්ගාමග්ග ඤාණදස්සන විසුද්ධි නිද්දේසය - හේ.මු. 473)]

දක්වන ලද විශුද්ධිමාර්ග පාඨයෙහි ද නාමරූප ධර්මයෝ පෙර නොතිබීම හටගෙන ඉතිරි නැතිවම නිරුද්ධ වී යන බව දක්වයි. ථේරවාදී විපස්සනා මාර්ගය දක්වන සුප්‍රසිද්ධ මේ ග්‍රන්ථයෙහි බුද්ධ මතඥ මහාකාශ්‍යප ආදී මහරහත් ථේරවාදී ආචාර්යන්වහන්සේලා විසින් තබන ලද අර්ථකථාවන්හි ම පිහිටා කරන ලද මෙම ප්‍රකාශය අනිත්‍යතාව යනු කුමක්ද යන්නට මනාව අර්ථ ප්‍රකට කරයි.

## IV. පටිසම්භිදාමග්ගප්පකරණ අර්ථකථාව

එසේම පටිසම්භිදාමග්ගප්පකරණයට අර්ථ සපයන අර්ථකථාචාර්ය මහානාම ස්වාමීන් වහන්සේද නාමරූපයන්ගේ යථාභූත ස්වභාවය දැක්වීමට මෙසේ නිදර්ශණ දක්වයි.

- **“එවං කිර නාමිමෙ ධම්මා අනුප්පන්නපුබ්බා උප්පජ්ජන්ති, උප්පන්නා නිරුජ්ඣන්ති”ති නිච්චනවාව හුත්වා සඞ්ඛාරා උපට්ඨහන්ති. න කෙවලඤ්ච නිච්චනවාව, සූරියුග්ගමනෙ උස්සාවබින්දු විය උදකබුබ්බුලො විය උදකෙ දණ්ඩරාජි විය ආරග්ගෙ සාසපො විය විජ්ජුප්පාදො විය ච පරිත්තට්ඨායිනො”**

[මෙසේ නම් මේ ධර්මයෝ පෙර නූපන්නාහු උපදිත්. උපන්නාහු නිරුද්ධ වෙත් යයි නිත්‍ය වශයෙන් නව (අලුත්) ධර්ම ලෙසම සංස්කාරයෝ වැටහෙත්. හුදෙක් නිත්‍ය වශයෙන් නව ධර්ම ලෙසට පමණක් නොව හිරු උදාවන කල්හි පිණිබිඳු මෙන් දිය බුබුල් බිඳෙන්නාක් මෙන් දියෙහි දඬුවකින් ඇඳි ඉරක් වහා නොපෙනීයන්නාක් මෙන් හිදි තුඩ අබ මොහොතක්ම රඳන්නාක් මෙන් විදුලි කෙටීමක් මොහොතක්ම පැවත නැතිවන්නාක් මෙන් ඉතා මද වූ කාලයක්ම ඨිතිය ඇත්තා වූ ධර්මසේ ද වැටහෙත්. (පටිසම්භිදාමග්ග අ.ක. - උදයබ්බය ඤාණ නිද්දේසවණ්ණනා - හේ.මු. පි.180)]

දක්වන ලද අට්ඨකථා පාඨයෙන් ද පැහැදිලි වනුයේ මොහොතක් පාසාම පෙර නොතිබූ සංස්කාරම ඉපිද නිරුද්ධ වන බවත් සෑම මොහොතකම උපදිනුයේ ද නව සංස්කාර බවත් යන්නය. සංස්කාරයන්ගේ ඨිතිය පිළිබඳව අදහස් දක්වන ආචාර්යන් වහන්සේ මොහොතකම ඨිතියක් හෙවත් පැවතීමක් ඇති බව උපමා මගින් දක්වයි. මෙයින් ද ගම්‍යවනුයේ පෙර නූපන් සංස්කාරයෝම ඉපිද මොහොතක් පැවත නිරුද්ධ වන බවයි.

දක්වන ලද අර්ථකථා සාධක පාඨ වලට අනුව භාග්‍යවතුන්වහන්සේගේ අදහස දන්නා වූ සන්තිකාවචර බුද්ධ පුත්‍රයන්වහන්සේලා තැබූ සියළු අර්ථකථා වලින් ද ගම්‍යවනුයේ “අනිත්‍යතාවය

යනු පෙර නූපන් ධර්මයෝම ඉපිද නිරවශේෂව නිරුද්ධවන බවය'' එබැවින් ශ්‍රද්ධාවෙන් පැවිදි වූ සියළු කුලපුත්‍රයන් විසිනුත් නිවන් සැපය සොයන සත්පුරුෂයන් විසිනුත් අනිත්‍යතාවය පිළිබඳ මේ දහම් අරුත මෙලෙසින්ම දරාගත යුතුය.

## නාමරූපයන්ගේ ක්ෂණික නිරෝධය පිළිබඳ ටීකාවන්හි අන්තර්ගතය

### I. අභිධම්මත්ථවිකාසිනී ටීකාව

**"අභිධම්මාවතාර"** ග්‍රන්ථයට ටීකාචාර්ය සාරිපුත්ත ස්වාමීන්වහන්සේගේ ශිෂ්‍යයෙක් වන සුමංගල ස්වාමීන්වහන්සේ විසින් ලියන ලද **"අභිධම්මත්ථවිකාසිනී"** ටීකාවෙහි මෙසේ සඳහන් වේ.

- **"අයං හි පඨමං පච්චයතො උදයබ්බයං මනසිකරොන්තෝ පච්ඡා අවිජ්ජාදිකෙ පච්චය ධම්මෙ විස්සජ්ජෙත්වා උදයබ්බයවන්තෙ ඛන්ධෙ ගහෙත්වා තෙසං පච්චයතො උදයබ්බදස්සන මුඛෙන ඛණතොපි උදබ්බයං මනසිකරොති තස්ස යදා ඤාණං තික්ඛං විදසං හුත්වා පවත්තති, තදාරූපාරූප ධම්මා ඛණෙ ඛණෙ උප්පජ්ජන්තා භිජජන්තා ච හුත්වා උපට්ඨහාති"**

[මේ යෝගාවචර තෙමේ පළමුව ප්‍රත්‍යවශයෙන් උදයවැය මනසිකාර කරනුයේ පසුව අවිද්‍යාදී ප්‍රත්‍ය ධර්ම හැරපියා උදයවැය ලක්‍ෂණයන්ගෙන් යුත් ස්කන්ධයන් ගෙන ප්‍රත්‍යවශයෙන් උදයවැය දැකීම් මූලයෙන් ක්‍ෂණවශයෙන් ද ඒ ස්කන්ධයන්ගේ උදයවැය මනසිකාර කරයි. යම් කලෙක ඒ යෝගාවචරයාගේ ඤාණය තියුණුව විසදවී පවතීද, එකල්හි රූපාරූප ධර්මයෝ ක්ෂණයක් ක්ෂණයක් පාසා උපදින්නාහු ද බිඳෙන්නාහුද වී වැටහෙත්. (අභිධම්මත්ථවිකාසිනී ටීකා - මග්ගාමග්ගඤාණදස්සනවිසුද්ධි කතා)]

මේ ටීකා පාඨයෙන් කියැවෙනුයේ උදයවැය ඤාණයට රූපාරූප ධර්මයන් අරමුණු වන ආකාරය ය. එහිදී ටිකාචාර්යයන්වහන්සේ රූපාරූප ධර්මයන්ගේ ක්ෂණයක් ක්ෂණයක් පාසා සිදුවන ඉපදීම් බිඳීම් ස්වභාවයම මතුකර දක්වයි. මෙයිනිදු අනිත්‍යතාවයේ යථාස්වභාවය මැනවින් මතු කර දක්වයි.

## II. විශුද්ධිමාර්ග මහාටීකාව

තවද විශුද්ධිමාර්ග මහාටීකාවේ මෙසේ දැක්වේ.

- **"ඛයට්ඨේනාති ඛය සවභාවතො, යස්මා රූපං ඛය සවභාවං උපපජ්ජිත්වා ඛයං වයං භෙදං ගච්ඡති තස්මා අනිච්චන්ති අත්ථො"**

[ඛයට්ඨේන යනු ක්ෂය ස්වභාවයෙන් යන්නයි. යම්හෙයකින් රූපය ක්ෂය ස්වභාව ඇත්තේ ද ඉපිද ක්ෂය භාවයට නැතිවීම් ස්වභාවයට බිඳෙන භාවයට යයි ද එහෙයින් අනිච්චං යන අර්ථය යි. (විසුද්ධිමග්ගමහාටීකා - මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි වණ්ණනා)]

**"අනිච්චං ඛයට්ඨේන"** යන තන්හි **"ඛයට්ඨේන"** පදයට අර්ථ විග්‍රහ කරන ටීකාචාරීන් වහන්සේ ද අනිත්‍යතාව යන්න සඳහා ලබාදෙනුයේ ඉපදෙන බිඳෙන භාවය යන අර්ථයමය. ටීකා යුගයට පැමිණෙන විට ද ථේරවාදී ආචාර්ය පරම්පරාව රැගෙන ආ අනිත්‍යතාව පිළිබඳ දහම් අර්ථය, බුද්ධ මතය තවතවත් අර්ථ දීප්තියට පැමිණෙනුයේ විනා අර්ථ හානියක් නොවූ බව මෙනයින්ද දත යුතු ය. එබැවින් ථේරවාදී ආචාර්ය පරම්පරාවෙන් පැමිණි පිරිසිදු දහම් අර්ථයම ගෙන සමථ විපස්සනා වඩා මගඵල නිවන් සාක්ෂාත් කරගැනීමට සුධීහු අප්‍රමාදී වෙත්වා!

**මීළඟ ලිපියෙන් පෙළ අටුවා ටීකා වල සඳහන් වූ අර්ථයන් ම වර්තමාන කාලයේ ථේරවාදී සම්ප්‍රදාය තුළ විපස්සනා භාවනා ව පිණිස භාවිතා කරන්නේ දැයි විස්තර කරන්නෙමු.**

## 4. අනිත්‍යතාවය පිළිබඳව සුප්‍රකට මෑතකාලීන ථේරවාදී භාවනා ආචාර්යවරුන්ගේ මත

**පසුගිය ලිපිපෙළින් අපි ත්‍රිපිටක පෙළ අටුව ටීකාවන්හි අනිත්‍ය යන්නට ලබාදුන් අර්ථකථනයන් විස්තර කළෙමු. මේ ලිපියෙන් ඒ අර්ථකථනයන්ම යොදාගෙන වර්තමාන ථේරීය ඇදුරන් විපස්සනා භාවනාව සිදුකරන්නේදැයි විස්තර කරන්නෙමු.**

මෙකල සමථ විපස්සනා භාවනාවන්හි කෝටිප්ප්‍රාප්ත ආචාර්යවරු වැඩවාසය කරන්නේ බුරුම රටේ බව සියළු යෝගාවචරයන්ගේ අවිවාදාත්මක පිළිගැනීමයි. එයිනුත් අද මුළු ථේරවාදී ලෝකය පුරා ව්‍යාප්ත වී ඇති භාවනා ක්‍රම වනුයේ අතිපූජ්‍ය මහා සී සයාඩෝ ස්වාමීන්වහන්සේගේ උපදේශනය අනුව සැකසුණු “ **මහා-සී** ” භාවනා ක්‍රමයත්, අතිපූජ්‍ය පා අවුක් සයාඩෝ ස්වාමීන්වහන්සේගේ උපදේශනය අනුව සැකසුණු “ **පා-අවුක්** ” භාවනා ක්‍රමයත්ය. අනිත්‍යතාවය පිළිබඳ මේ සුප්‍රකට කර්මස්ථානාචාර්යයන් වහන්සේලාගේ අදහස් මෙසේය.

### ❖ මහා සී භාවනා ක්‍රමය තුළින් අනිත්‍යතාවය

මහා සී භාවනා ක්‍රමය සෘජුවම පෙළ අර්ථකථාව සහ විශුද්ධමාර්ගය පදනම් කොට බිහි වූ භාවනා ක්‍රමයකි. අතිපූජ්‍ය මහාසී සයාඩෝ මහතෙරුන් වහන්සේ විසින් බුරුම බසින් රචිත “විපස්සනා නයප්පකරණය” නමැති ග්‍රන්ථයෙහි පෙළ අටුවා ටීකාවන්ගෙන් සාධක සූත්‍ර දක්වමින් මෙම භාවනා ක්‍රමය පෙළ අටුවා ටීකාවන්ට අනුගතවම ලියූවක් බවට සාධනය කරයි. මෙම ග්‍රන්ථය සහ භාවනා ක්‍රමය බුරුම රටේ මෙන්ම ලොව පුරා භාවනා යෝගාවචරයින් අතිශයින් ගෞරවපූර්වකව පිළිගනී.

මෙම ග්‍රන්ථය බුරුම ජාතික පූජ්‍ය යූ. ඤාණින්ද සයාඩෝ මහ තෙරුන්වහන්සේත්, පූජ්‍ය නා උයනේ අරියධම්ම ස්වාමීන්වහන්සේත් පූජ්‍ය උඩරියගම ධම්මජීව ස්වාමීන් වහන්සේත් එකතුව සිංහලයට පරිවර්තනය කොට “මහා සී විපස්සනා භාවනා ක්‍රමය” යන නමින් මීතිරිගල නිස්සරණ වනය සංරක්ෂණ මණ්ඩලයේ ප්‍රකාශනයක් ලෙස එළි දක්වා ඇත. එම සිංහල පරිවර්තනය කොටස් කිහිපයකින් යුක්ත වන අතර එහි පරිච්ඡේද අංක 06 හි “සම්මසන ඤාණය” නම් අනු මාතෘකාව යටතේ මෙසේ සඳහන් වේ.

**“තවදුරටත් ඉදිරි භවයේ පහළ වන්නා වූ තාක් රූපයෝ ද දැන් මෙනෙහි කොට වටහාගත් රූපයන්ටම සමානය. මෙම රූපයන් මෙන්ම එක ක්ෂණයකින් නිරුද්ධවන්නෝම ය. වෙනත් භවයක් තෙක් කිසිවක් ගමන් නොකරන්නේමය. පහළ වූ තැනම එම භවයෙහිදීම නිරුද්ධ වීම සිදුවන බැවින් අනිත්‍යයම යැයි ව්‍යස්ථාපනය කරයි. සම්මස්සන ඥානයක්ම ය. තවදුරටත් මතු කාලයේ පහළවන්නා වූ තාක් රූපයන් දැන් මේ මෙනෙහි කොට වටහා ගත් රූපයන් මෙන් නිරුද්ධ වනවා ම වන්නේ ය. වෙනත් චිත්තක්ෂණයක් කරා කිසිම රූපයක් පවතිනවා නොවේ. ඒවා පහළ වූ තැනම එම ක්ෂණයෙහිම නිරුද්ධ වන්නා වූ බැවින් අනිත්‍ය වන්නේමැයි පිරිසිඳින්නේ ය. සම්මස්සන ඥානයක් ම වේ. ”**

ග්‍රන්ථයෙන් කොටසක් උපුටා දැක්වීම වශයෙන් මෙම පාඨය දැක්වුවද මෙම පරිච්ඡේදය පුරාවටම විවිධ ක්‍රම වලින් අනිත්‍ය ලක්ෂණය මෙනෙහි කරන ආකාරය දක්වා ඇත. මෙයින් ද ජීවමාන බුදුරජාණන්වහන්සේගේ ඒ ශ්‍රී මුඛ දේශනාව අර්ථ නොනසා පුරාණ මහරහතන්වහන්සේලාගේ පටන් වර්තමානය දක්වා ථේරවාදී ආචාර්ය පරම්පරාවෙන් පැමිණි බව වටහා ගත යුතුය.

## ❖ “පා-අවුක්” භාවනා ක්‍රමය තුළින් අනිත්‍යතාවය

ථේරවාදීන්ගේ සුප්‍රකට භාවනා ග්‍රන්ථය වන “විශුද්ධිමාර්ග”යෙහි එන ධ්‍යාන අභිඥා පූරණය කොට ධ්‍යාන පාදක කොට ගෙන විපස්සනාව වඩන “සමථ පූර්වාංගම විපස්සනාව” ඒ නයින් ම පුහුණු කරන භාවනා ක්‍රමය වනුයේ “පා-අවුක්” භාවනා ක්‍රමය යි. බුරුම රට මෝලම්‍යායන් පා-අවුක් චිත්තල පබ්බත භාවනා මධ්‍යස්ථානාධිපති අති පූජ්‍ය පා-අවුක් සයාඩෝ ස්වාමීන් වහන්සේ මෙම භාවනා ක්‍රමය තම ශිෂ්‍යයන්ට පුහුණු කරයි.

සියළු ථේරවාදී ලෝකයට ඉපැරණි ථේරවාදී බෞද්ධ භාවනා ක්‍රමය මතු කර දක්වන මෙම භාවනා ක්‍රමය ද පෙළ අටුවා ටීකා වලට අනුගතවම බිහි වූ භාවනා ක්‍රමයකි. අතිපූජනීය පා-අවුක් සයාඩෝ ස්වාමීන් වහන්සේගේ දේශනා ඇසුරින් ඉංග්‍රීසි බසින් රචිතව අතිපූජනීය නා උයනේ අරියධම්ම මහතෙරුන්වහන්සේගේ පෙරවදනක් සහිතව “ප්‍රඥාවේ ආලෝකය” නමින් මෙම ග්‍රන්ථය සිංහලයට පරිවර්තනය කොට ඇත්තේ කොළඹ කාන්තා විද්‍යාලයේ විශ්‍රාමික ගුරුමාතාවක් වන සිල්වියා ගුණතිලක මහත්මිය විසිනි. එම ග්‍රන්ථයෙහි 173 පිටුවේ මෙසේ සඳහන් වේ.

**“අතීත අනාගත පච්චුප්පන්න රූප පහළවීමෙන් පසු නිරුද්ධ වන බැවින් අනිත්‍ය වේ. “බය” යනු තවදුරටත් නොපවත්නා බවයි. රූප හටගැනීමට පෙරත් නිරුද්ධ වීමෙන් පසුත් නොපවතී. ඒක් ස්ථානයක ගොඩගැසෙන මළකඳන් මෙන් ගොඩගැසෙන රූප නැත. පහළවීමට පෙරත් පහළවීමෙන් පසුත් නොපැවතීම පරමත්‍ථ රූපයන්ගේ ස්වභාවය යි.”**

ග්‍රන්ථයෙහි සඳහන් වන මෙම පාඨයෙන් ද නාමරූපයන්ගේ සිදුවන ක්ෂණයක් ක්ෂණයක් පාසාම බිඳී යාම මොනවට තහවුරු වේ. මින් වසර දෙදහස් හයසියයකට පෙරතුව දේශිත බුද්ධ භාෂිතයත් බුද්ධ පරිනිර්වාණයෙන් තුන් මසකට අනතුරුව පැවති ප්‍රථම ධර්ම සංගායනාවෙන් සංගීතියට නැංවූ ආචාර්යවාදය හෙවත් අර්ථකථාවත් ඉන් වසර එක්දහස් හයසීයකට පමණ අනතුරුව පොළොන්නරු යුගයෙහි ලියවුණු ටීකා ග්‍රන්ථත් අද සුප්‍රකට ථේරවාදී මහා ස්ථවිරයන් වහන්සේලාගේ භාවනා ප්‍රතිපදාත් අර්ථ වශයෙන් සුළුවෙන් හෝ පරස්පර භාවයක් නොමැති බැවින් හැඟෙනුයේ ඒකාන්තයෙන් මේ ථේරවාදී ආචාර්යපරම්පරාව මේ නිර්මල ධර්ම විනය අරුත් නො නසා පරපුරින් පරපුරට රැගෙන ආ බව නොවේද? ශ්‍රී සුගත ශරීරයෙන් ගලා ගිය දහම් රුධිරය කොණ්ඩඤ්ඤ ආදී මහරහත් සඟ පරපුරෙන් ඇරඹ සාරිපුත්ත මොග්ගල්ලාන කස්සප ආනන්ද නන්ද රාහුල උපාලි ආදී ඒ මහරහතන් වහන්සේලාගේ ශරීර තුළින් ගලා විත් සබ්බකාමී මොග්ගලීපුත්ත තිස්ස ආදී මහරහත් ශරීර ස්පර්ශ කොට අනුබුදු මිහිඳු මාහිමිගේ සිරුරින් අරිට්ඨ ආදී තම්බපණ්ණී දීප මහරහත් පරපුර ලැබ ගලා ආ ඒ දහම් රුධිරය අදටත් ථේරීය භික්ෂු පරපුරේ සිරුරු තුළ ගලා බස්නා බවට මෙයට වඩා තවත්

නිදසුන් නොවූමනා නොවේද? එබැවින් නිර්මල බුදුසසුනක අඛණ්ඩ පැවැත්මක් සොයන ශාසනස්ප්‍රීතිකාමී සත්පුරුෂයෝ මේ ථේරවාදී දහම් අරුත්ම ස්වකීය සිත් සතන්වල රඳා ගනිත්වා.

මෙසේ ථේරීය ඇදුරුපරපුරෙන් පැමිණි මේ දහම් අර්ථ මෙකලද මේ පින්බිමේ නිරුපද්‍රිතවම පවතී. මහනුවර යුගයේ අවසන් සමයේ පිරිහී තිබූ ලාංකීය සසුන් කෙත වැලිවිට සරණංකර සඟරජ හිමියන්ගේ දැතින් නැවත අස්වද්දා සියම් අමරපුර රාමඤ්ඤ ත්‍රෛයිනිකායික සුපේශල ශික්ෂාකාමී ධර්මධර විනයධර භාවනායෝගී මහාසංඝරත්නයේ ආශීර්වාදයෙන් අදටත් තෙවලා දහම් අරුත් අටුවා ටීකා සහිතවම දරන්නා වූ සුපටිපන්න මහසඟ ගණ ලෝ සතට නිවන් මඟ පාදමින් සසුන් පිළිවෙත් පුරනා බව සුධීහු දතයුත්තාහ. මේ අනිත්‍යතාවය පිළිබඳව සමීප අතීතයේ වැඩ සිටි ලාංකේය මහතෙරුන් වහන්සේලාගේ අර්ථ දැක්වීමය.

### ❖ විදර්ශනා භාවනා ක්‍රමය - රේරුකානේ චන්ද්‍රවිමල මහතෙරුන් වහන්සේ

රේරුකානේ චන්ද්‍රවිමල මහතෙරුන් වහන්සේ යනු ලාංකේය ථේරවාදී භික්ෂු පරපුරේ මෑතකාලීනව පහළ වූ ශ්‍රේෂ්ඨ ධර්මධරයෙකි. එසේම යෝගාවචරයෙකි. තෙරුන්වහන්සේ විසින් රචිත ග්‍රන්ථ පෙළ ස්වකීය ධර්මපටිභානය විදහාපාන කදිම නිදසුනකි. "සිල් ඇත්නම් රේරුකානේ හාමුදුරුවන්ගේ පොත් ටික ගෙන කැලයට ගියත් නිවන් දකින්න පුළුවන්" යයි මෙකල ථේරීය ඇදුරු පරපුරේ ජීවමාන ආචාර්යවරු පවසන්නේ පෙර වචනය තහවුරු කරමිනි.

ස්වාමීන් වහන්සේ විසින් රචිත විදර්ශනා භාවනා ක්‍රමය ග්‍රන්ථයෙහි 114 පිටුවෙහි (2014 - 23 වෙනි මුද්‍රණය) අනිත්‍යතාවය පිළිබඳව මෙසේ සඳහන් වේ.

**"වැසි වස්නා කල්හි ජලාශ වල දිය බුබුළු නැගි නැගී වහ වහා බිඳී යන්නාක් මෙන් ද බෙරයකට ගසන කල්හි හඬ නැගි නැගී වහා අතුරුදහන් වන්නාක් මෙන්ද සංස්කාරයෝ ඉපිද ඉපිද වහ වහා නිරුද්ධ වෙති. නිරෝධ යනු කිසිවක් ඉතිරි නොවී නැති වී යෑම ය. එයට බිඳීම යයි ද කියනු ලැබේ. ඇසිපිය හෙළීමට ගත වන කාලය තරම් වත් පවත්නා සංස්කාරයන් ඇත්තේම නැත. එය තේරුම් ගැනීමට අපහසු කාරණයකි. වැඩි දුරටත් කරුණු සොයා දන්නවුන් ගෙන් ද කරුණු අසා බලා එය අවබෝධ කර ගත යුතුය. සංස්කාරයන්ගේ ඒ වහා නිරුද්ධවන්නා වූ ස්වභාවය බිඳෙන්නා වූ ස්වභාවය අනිත්‍ය ලක්ෂණයයි"**

මහතෙරුන්වහන්සේගේ අර්ථ දැක්වීමෙන් ද ප්‍රකට වනුයේ අනිත්‍යතාවය යනු සංස්කාරයන්ගේ ඉපිද බිඳෙන ස්වභාවයම බවයි. ඒ අනුව ථේරවාදී පරම්පරානුයාත ධර්මාර්ථයම තෙරුන්වහන්සේ ද දරන බව ගම්‍ය වේ.

තවද මෑතකාලීනව වැඩ වාසය කළ ලක් සසුන් අඹරේ දීප්තිමත් තරු වූ ධර්මධර විනයධර සුපේශල ශික්ෂාකාමී යෝගාවචර ස්වාමීන් වහන්සේලා විශාල ප්‍රමාණයක් පෙළ අටුවා ටීකා වලට අනුවම යමින් ඉහත දක්වන ලද අර්ථ විග්‍රහ සහිතවම අනිත්‍යතාවය පිළිබඳව දහම් අර්ථ ඉදිරිපත්කොට ඇත්තාහ. ඒ අතුරින් දෙව්නුවර ඤාණාවාස මහනාහිමි, පණ්ඩිත මාතර ශ්‍රී ඤාණාරාම හිමි, නා උයනේ

අරියධම්ම නාහිමි, කහටපිටියේ සුමතිපාල හිමි වැනි ශ්‍රේෂ්ඨයතිවරු යෝගාවචර සංසපිතෘන්වහන්සේලා වූහ. එකී ස්වාමීන්වහන්සේලාගේ ද ග්‍රන්ථ දේශනා ආදීන්හි ද අනිත්‍යතාව සඳහා දක්වන ලද අර්ථයම ඇති බව සොයා බලන්නෙකුට මැනවින් වැටහේ.

මෙතුවක් දක්වන ලද්දේ අනිත්‍ය ලක්‍ෂණය යනු කුමක්ද යන්නත් එහි සැබෑ දහම් අර්ථය කුමක්ද යන්නත් ජීවමාන බුදුන් කල සිට අද දක්වා ථේරවාදී ආචාර්ය පරම්පරාව තුළින් ඒ අනිත්‍ය පදය අර්ථ නොනසා රැගෙන විත් වර්තමානයේ ථේරවාදීන් ද ඒ දහම් අර්ථය දරමින් විපස්සනා භාවනාවන් සඳහා යොදා ගන්නා ආකාරයත්ය. මේ සටහන දීර්ඝ වන බැවින් දුක්ඛ අනාත්ම යන දෙපදය යොදා ගනිමින් කරුණු නොදැක්වූයේ වුවත් එහිලා ද අර්ථ සාධනය මෙසේම යැයි දතයුතුය. ඒවායේ අර්ථයන් ආචාර්ය පරම්පරාවෙන් පැමිණි ආකාරය සාධක සූත්‍ර දැක්වූ ග්‍රන්ථයන්ගෙන් ම බලා දත යුතුය.

**මීළඟ ලිපියෙන් දුක්ඛ ලක්‍ෂණය සඳහා පෙළ අර්ථකථා ටීකාවන්හි පැමිණි දහම් අර්ථය කුමක්ද යන්න විස්තර කරන්නෙමු.**

## 5. දුක්ඛ ලක්‍ෂණය පිළිබඳව දතයුතු කරුණු

**පසුගිය ලිපි පෙලින් අපි ත්‍රිපිටක පෙළ අටුවා ටීකාවන්හි අනිත්‍ය යන්නට දුන් අර්ථකථනයන් මොනවාද, වර්තමානයේ ථේරීය ඇදුරන් ඒ අර්ථකථනයන් යොදාගෙනම විපස්සනා භාවනාව සිදුකරන්නේද යන්න විස්තර කළෙමු. මෙම ලිපියෙන් සංස්කාරයන්ගේ දුක්ඛ ලක්ෂණය පිළිබඳව ත්‍රිපිටක පෙළ අටුවාවන්හි පැමිණි අර්ථකථන විස්තර කරන්නෙමු.**

සැම සත්ත්වයෙක් පාහේම සැපයට කැමති ය. සැපය ලබා ගැනීම පිණිස සත්ත්වයෝ නොකරන්නා වූ දෙයක් නම් නැත්තාහ. ඒ සඳහා ඔවුහු කුසල් ද අකුසල් ද කරන්නාහ. නමුත් සැප සොයන්නා වූ සත්ත්වයන්ට කොතරම් සැප ලැබුණේ ද නැවත නැවත දුකටම පත්වන්නේ ය. එයට හේතුව වනුයේ සැප වේදනාව ද ඇතුළුව සියළු සංඛත ධර්මයන් තුළ දුක්ඛ ලක්‍ෂණය ඇති බැවිනි. කුමන අර්ථයකින් සංස්කාරයෝ දුක්ඛයෝ ද යන පැනයට පෙළ අර්ථකථාවන්හි සඳහන් පිළිතුරු මෙසේ ය.

### I. පටිසම්භිදාප්‍රකරණය - අභිඤෙය්‍යා නිර්දේශය

පටිසම්භිදාප්‍රකරණයෙහි අභිඤෙය්‍යා නිර්දේශයෙහි දුක්ඛයාගේ දැනගතයුතු අර්ථ පිළිබඳව මෙසේ දැක්වේ.

- **“දුක්ඛස්ස පීළනට්ඨො අභිඤ්ඤෙය්‍යො; දුක්ඛස්ස සඞ්ඛතට්ඨො අභිඤ්ඤෙය්‍යො; දුක්ඛස්ස සන්තාපට්ඨො අභිඤ්ඤෙය්‍යො; දුක්ඛස්ස විපරිණාමට්ඨො අභිඤ්ඤෙය්‍යො.”**

[දුඃඛයාගේ පීඩනාර්ථය දතයුතු යැ .දුඃඛයාගේ සඞ්ඛතාර්ථය දතයුතු යැ. දුඃඛයාගේ සන්තාපාර්ථය දතයුතු යැ. දුඃඛයාගේ විපරිණාමාර්ථය දතයුතු. (පටිසම්භිදාමග්ගප්පකරණය - ඤාණකථා - බු.ජ.මු. 34)]

<u>පටිසම්භිදාමග්ග අට්ඨකථාවෙහි ඒ සිවුපදයන් සඳහා මේ අර්ථ සපයා ඇත.</u>

- **“දුක්ඛදස්සනේනේව පීළනට්ඨො. දුක්ඛායූහනසමුදයදස්සනෙන සඞ්ඛතට්ඨො. සබ්බකිලෙසසන්තාපහරසුසීතලමග්ගදස්සනෙන සන්තාපට්ඨො. අවිපරිණාමධම්මනිරොධදස්සනෙන විපරිණාමට්ඨො.”**

[ඉපදීම බිඳීම දෙකින් වන දුක්ඛය දැක්වීම් වශයෙන් ම ‘පීළනාර්ථය’ය. සංස්කාරයන් ඉපිදවීමට ප්‍රත්‍ය රැස්කිරීමේ ඇති දුක්ඛිතභාවය දැක්වීම් වශයෙන් 'සංඛතාර්ථය' ය. සියලු කෙළෙස් දාහයන් වෙතට ගෙනයන මාර්ගය බව දැක්වීම් වශයෙන් ‘සන්තාපනාර්ථ’ය. සංස්කාර ධර්මයන් ගේ ජරාව නම් වූ විපරිණාමයත් මරණය නම් වූ නිරෝධයත් දැක්වීම් වශයෙන් ‘විපරිණාම ධම්මා’ය. (පටිසම්භිදාමග්ගප්පකරණ අ.ක. - අභිඤ්ඤෙය්‍යා නිද්දේසය - හේ.මු. 72)]

එහි පීළනාර්ථය යනු පීඩිත වන පෙළෙන බවය. සත්ත්වයෙකු ඉපදුණු ක්‍ෂණයෙහි මියයන්නේ නම් එම සත්වයා දුක්ඛිතයෙකැයි කියති. යම් වස්තුවක් ලැබී වහා නැති වී යන්නේ නම් එම වස්තුව දුක්ඛ සහගත දෙයකි. මෙහිදී අදහස් කරනුයේ ඒ සත්ත්වයා හෝ වස්තුව අයත් කරගෙන සිටින

කෙනාට උපදින දුක නොව ඒ සත්ත්වයාගේ හෝ වස්තුවේ ඇති නැසීමෙන් කෙළවර වන බව නමැති අවාසනාවන්ත භාවයයි. දුක්සහගතභාවයි එමෙන් ම සියළු අවිඤ්ඤාණික සවිඤ්ඤාණික ධර්මයෝම ක්‍ෂණයක් ක්‍ෂණයක් පාසා ඉපිද බිඳීයන බැවින් පීළනාර්ථයෙන් දුක්ඛයෝ ය.

එසේම සංස්කාරයන් ඉපදෙනුයේ ප්‍රත්‍යයන් එක් රැස්වීමෙනි. ඉදින් යම්ම දෙයක් ලබාගැනීමට නම් ඒ දෙය ලැබෙන හේතු ඒකරාශී කළ යුතුය. රැකියාවක් ලබාගැනීමට මහන්සි වී ඉගෙනගත යුතුය. යහපත් ජීවිතයක් ගත කිරීමට වෙහෙස වී මුදල් ඉපයිය යුතුය. මෙසේ සංස්කාර ඉපදවීමට කළ යුතු ප්‍රත්‍ය රැස්කිරීම දුකින් යුතුව වෙහෙසෙමින් කළ යුතු බැවින් සංඛතාර්ථයෙන් සංස්කාරයෝ දුක්ය හ.

තවද කෙලෙස්දාහයෙන් සත්ත්වයන් තවන බැවින් පංචුපාදානස්කන්ධ සංඛ්‍යාත සියළු ආත්මභාව දුක්ඛසහගතය. එසේම සියළු කාම වස්තු කෙලෙස් දාහය ඉපිදීමට හේතුවන බැවින් දුක්ඛයෝ ය. මෙසේ සියළු සංස්කාරයෝ කෙලෙස් දාහයෙන් තවන සන්තාපාර්ථයෙන් දුක්ඛයෝ ය.

කොතරම් වෙහෙස වී ලබාගන්නා දෙයක් වුවද කලකදී වෙනස් වී නැතිවී යන්නේය. සවිඤ්ඤාණක වස්තු ද ජරාවට මහළුබවට ආදියට පැමිණ මරණයෙන් කෙළවර වන්නේ ය. අවිඤ්ඤාණ වස්තු ද දිරායාමට පැමිණ විනාශ වී යන්නාහ. මෙසේ සියළු සංස්කාරයෝ ජරා මරණ දෙකින් හෙවත් විපරිණාමයට පත්ව නිරුද්ධවීම යන ස්වභාවයෙන් යුක්ත හෙයින් විපරිණාමාර්ථයෙන් දුක්ඛයෝ ය. දක්වන ලද සතර වැදැරුම් ආකාරයන්ගෙන් ද සංස්කාරයෝ දුක්වන්නාහ.

## II. සංයුක්තනිකාය - රාහුල සංයුක්තය

තවද සංයුක්තනිකායෙහි රාහුල සංයුක්තයෙහි පළමු සූත්‍රයට ලියූ අර්ථකථාවෙහි මෙසේ සඳහන් වේ.

- **"දුක්ඛන්ති චතූහි කාරණේහි දුක්ඛං දුක්ඛමනට්ඨේන දුක්ඛවත්ථුකට්ඨේන සතතසම්පීළනට්ඨේන සුඛපටිපක්ඛෙනාති"**

["දුක්ඛං යනු සිව්කාරණයකින් 'දුක්ඛං' වේ. දුක්‍ෂමනාර්ථයෙන්, දුකට වස්තුවන අර්ථයෙන්, නිරන්තරයෙන් පෙළන අර්ථයෙන්, සුඛයට ප්‍රතිපක්‍ෂ වන අර්ථයෙන් ය" (සංයුක්ත නිකාය අ.ක. II - රාහුල සංයුක්තය - හේ.මු.158)]

I. සංස්කාරයෝ දුකින් ඉවසියයුතු හෙයින් දුක්ඛයෝ ය. සංස්කාරයන් ගේ ඇති ජරා මරණ විපරිණාමය සංස්කාරයන් සමග ගණුදෙනු කරන්නන්ට දුකින් යුතුව ඉවසන්නට වන්නේය. එබැවින් සංස්කාරයෝ දුක්ඛයෝ ය.

II. ස්කන්ධයෝ දුකට වස්තු වන හෙයින් ද දුක්ඛය. දුක ඇතිවන්නේ ස්කන්ධයන් නිසාය. ස්කන්ධයන් පහළ වූ බැවින් නොහොත් සත්ත්වයන් උපන් බැවින් දුක උපදින්නේය. සත්ත්වයන් නූපන්නේ නම් දුකක් නැත. එබැවින් ම ස්කන්ධයන්ගේ අනුප්පාද නිරෝධයම සුවය යැයි කියති. මෙලෙස දුක්ඛයන්ට වස්තුවන හෙයින් ආධාරවන හෙයින් ස්කන්ධයෝ දුක්ඛයෝ යයි දත යුතුය.

III. ස්කන්ධයන් විසින් ස්කන්ධ සංඛ්‍යාත ආත්මභාවය පෙළන හෙයින් ද දුක් වේ. ජාති ජරා ව්‍යාධි මරණයට පත්වන්නේ ස්කන්ධයෝය. එසේ ජාත්‍යාදීන්ගෙන් නිරන්තරයෙන් පෙළන හෙයින් ස්කන්ධයෝ දුකය.

IV. ස්කන්ධයෝ සුඛයට ප්‍රතිපක්ෂ හෙයින් ද දුක්ඛයෝය. සුඛය නම් ස්කන්ධාදීන්ගෙන් තොර නිවනයි. ස්කන්ධයෝ යම් තැනක උපදිත් ද ඒ උපදිනුයේම දුක ය. ඒ නිසා ස්කන්ධයන්ගේ නොපැවතීම නම් පරම සුඛයට ප්‍රතිපක්ෂ නිසා ද ස්කන්ධයන් දුක්ඛ ය. මෙසේ ද සංස්කාරයෝ දුක්ඛයෝ ය.

## III. පටිසම්භිදාමග්ගප්පකරණය සම්මසන ඥාන නිර්දේශය

තවද පටිසම්භිදාමග්ගප්පකරණයෙහි සම්මසන ඥාන නිර්දේශයෙහි මෙසේ සඳහන් වේ .

❖ **“දුක්ඛං භයට්ඨෙන”**

එහි තේරුම නම් “භයාර්ථයෙන් සංස්කාරයෝ දුක්ඛ”ය යන්නයි. (බු.ජ.මු. 102)

සංස්කාරයෝ භය ඉපදීමට වස්තු වන නිසාත් භය උපදවන නිසාත් භයාර්ථයෙන් දුක්ඛ වේ. ඉදින් පංචඋපාදානස්කන්ධයක් නොතිබුණේ වී නම් භය උපදින්නේ නැත. පංචුපාදානස්කන්ධය වස්තු කරගෙනම භය උපදී. එසේම සත්ත්වයාට ජාති භය, ජරා භය, ව්‍යාධි භය, මරණ භය උපද්දවනුයේ ස්කන්ධයෝ ය. එබැවින් ස්කන්ධයෝ භය උපදවන්නෝය. මේ දෙඅරුතින් භයඅර්ථයෙන් ස්කන්ධයෝ දුක් වෙති.

මෙසේ සංස්කාරයෝ විවිධ අර්ථයන්ගෙන් දුක්ඛධර්මයෝ වෙති. මෙසේ නානාවිධ නයින් සංස්කාරයන්ගේ දුක්ඛ ලක්ෂණය දැකීම සංස්කාරයන් කෙරෙහි කලකිරීමක් ඇති වීමටත් ඉන් මිදීමේ බලවත් කැමැත්තක් ඇතිවීමටත් නිවන පරම සුවය සේ දැකීමටත් හේතුවේ.

**මීළඟ ලිපියෙන් සංස්කාරයන්ගේ අනාත්ම ලක්ෂණය පිළිබඳව විස්තර කරන්නෙමු.**

## 6. අනාත්ම ලක්ෂණය පිළිබඳව දත යුතු කරුණු

**පසුගිය ලිපිවලින් අපි ත්‍රිපිටක පෙළ අර්ථකථා ටීකාවන්හි අනිත්‍ය දුක්ඛ ලක්ෂණයන් සඳහා දක්වන ලද අර්ථකථනයන් විස්තර කළෙමු. මෙම ලිපියෙන් අපි අනාත්ම ලක්ෂණය පිළිබඳව ත්‍රිපිටක පෙළ අර්ථකථා ටීකාවන්හි දක්වන ලද අර්ථකථනයන් විස්තර කරන්නෙමු.**

බුදුරජාණන් වහන්සේ ලොව පහළ නොවූ කල්හි ද පණ්ඩිත මනුස්සයෝ සංස්කාරයන්ගේ අනිත්‍ය දුක්ඛ ලක්ෂණයන් දැන ගැනීමට සමත් වෙති. නමුදු අනාත්ම ලක්ෂණය දැක ගැනීමට සමත් නොවෙති. මහාබෝධිසත්ත්වයෙක් ම ලෝක සත්ත්වයා කෙරෙහි කරුණාවෙන් ලොව්තුරා බුදු බවට පැමිණ අනාත්ම ලක්ෂණය ලොවට ප්‍රකට කරවන්නේය. ආත්ම දෘෂ්ටියෙහි දැඩිව බැසගත් සත්ත්වයාට අනාත්ම ලක්ෂණය දැකීමට දුෂ්කරය. ආත්ම ලක්ෂණය පිළිබඳව පෙළ අර්ථකථාවන්හි මෙසේ සඳහන් වේ.

### I. පටිසම්භිදාමග්ගප්පකරණය - ලක්ඛණත්තික නිද්දේසය

❖ **"රූපං අනත්තා අසාරකට්ඨෙන"**
[රූපය ආසාරක අර්ථයෙන් අනාත්මය (පටිසම්භිදාමග්ගප්පකරණ - ලක්ඛණත්තික නිද්දේසය - බු.ජ.මු. 68)]

මෙයට අර්ථ සපයන පටිසම්භිදාමග්ග අට්ඨකථාචාරීන් වහන්සේ මෙසේ දක්වයි

❖ **"අනත්තා අසාරකට්ඨෙනාති ''අත්තනි වසීකාරකො වෙදකො සයංවසී''ති එවං පරිකප්පිතස්ස අත්තසාරස්ස අභාවෙන අනත්තා. යං හි අනිච්චං දුක්ඛං, අත්තනොපි අනිච්චතං වා උදයබ්බයපීළනං වා ධාරෙතුං න සක්කොති, කුතො තස්ස කාරකාදිභාවො. වුත්තඤ්ච ''රූපඤ්ච හිදං, භික්ඛවෙ, අත්තා අභවිස්ස, නයිදං රූපං ආබාධාය සංවත්තෙයා''තිආදි. ''අත්තසාරනිච්චසාරවිරහිතත්තා අනත්තා''ති එකෙ"**

[අනත්තා අසාරකට්ඨෙන යනු තමා කෙරෙහි වූ වශීකාරකයෙක් විඳින්නෙක් මැඩපවත්වන්නාවූ අයෙක් ඇත්තේය යන මෙසේ වූ පරිකල්පිත ආත්මසාරයාගේ අභාවයෙන් අනත්ත නම් වේ. යම් අනිත්‍ය වූ දුක් වූ ධර්මයක් තෙමේ ද අනිත්‍ය භාවය හෝ හටගැනීම් බිඳීම් වලින් පෙලනභාවය හෝ දරන්නට නොහැකිවෙයි ද. ඒ අනාත්ම ධර්මයට කාරක ආදීභාවයක් කොයින්ද? එහෙයින් භාග්‍යවතුන් වහන්සේ විසින් "මහණෙනි මේ රූපය ආත්ම වන්නේ නම් මේ රූපය ආබාධවීම පිණිස නොපවතින්නේය" යන ආදිය වදාළ සේක. එබැවින් මෙහි අනත්ත යනු ආත්මසාර නිත්‍යසාර විරහිත බැවිනි. (පටිකම්භිදාමග්ගඅට්ඨකථා - ලක්ඛණත්තික නිද්දේසය - හේ.මු. 99)]

ලෝකයේ තමන් කැමති දේ කැමති ලෙස පවත්නා අයවළුන්ට වශීකාරක යයි කියති. ලෝකයේ මන්ත්‍ර ගුරුකම් ආදියෙන් පුද්ගලයන් තමා කැමති විදිහට පවත්වන්නවුන්ට වසීකාරක යයි

කියනු ලැබේ මේ පංචඋපාදානස්කන්ධය එලෙස කැමති විදියට පවත්වන්වූ අයෙක් මේ තුළ නොමැති බැවින් ස්කන්ධයන්ට වසීකාරක නොවන අර්ථයෙන් අනාත්ම යයි කියනු ලැබේ.

ලෝකයේ සත්ත්‍වයෝ මම දුක් විඳිමි මම සැප විඳිමි යනාදී වශයෙන් විඳින පුද්ගලයකුගේ විද්‍යාමාන බවක් ප්‍රකාශ කරති. නමුදු මේ පංචඋපාදානස්කන්ධය තුළ වේදනුපාදානස්කන්ධයක් ඉපිද නිරුද්ධ වනවා මිස ඒ තුළ විඳීමේ ක්‍රියාව කරන පුද්ගලයකු නැති බැවින් ස්කන්ධයන්ට විඳින්නෙකු නොවන අර්ථයෙන් අනාත්ම යයි කියනු ලැබේ.

ලෝකයේ ඇතැමෙක් ලෝකය මැවූ සියල්ලන් මෑඩපවත්වන්නාවූ සර්වබලධාරී දෙවියෙක් බ්‍රහ්මයෙක් ඇතැයි කියන්නේය. මේ පංචුපාදානස්කන්ධය තුළ එසේ වූ ස්කන්ධයෝ මැඩපවත්වන්නෙක් නැති බැවින් මැඩ පවත්වන්නෙකු නොමැති අර්ථයෙන් ස්කන්ධයන් අනාත්ම යයි කියනු ලැබේ.

පංචස්කන්ධයන්ගේ මේ අනාත්ම ස්වභාවය දක්නාවූ තථාගතයන්වහන්සේ මේ පංචුපාදානස්කන්ධය තුළ තමන් කැමති ලෙස ස්කන්ධයන් හසුරුවන්නා වූ කාරකයෙක් සිටී නම් කායික මානසික රෝගයන් ඉපදීමට නොහැකි වන්නේ යැයි වදාළසේක. ඒ එබන්දෙක් සිටියේ වී නම් රෝග ඇතිවීම වළක්වා ගත හැකි බැවින.

එබැවින් සියලු සංස්කාර ධර්මයෝ වසීකාරක වේදක මැඩපවත්වන සත්ත්‍ව පුද්ගල ආත්ම සාරයෙන් ද ඉපදීම් බිඳීම් දෙකින් නොයුක්ත නොපෙරළෙන ස්වභාව සංඛ්‍යාත නිත්‍ය සාරයෙන් ද විරහිත බැවින් අනාත්ම වන්නාහ.

## II. විශුද්ධිමාර්ගයේ මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි නිර්දේශය

තවද විශුද්ධිමාර්ගයේ මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධි නිර්දේශයෙහි මෙසේ සඳහන් වේ.

❖ **"යස්මා ච "උප්පන්නා සඞ්ඛාරා ඨිතිං පාපුණන්තු, ඨානප්පත්තා මා ජීරන්තු, ජරප්පත්තා මා භිජ්ජන්තූ"ති ඉමෙසු තීසු ඨානෙසු කස්සචි වසවත්තිභාවො නත්ථි, සුඤ්ඤා තෙන වසවත්තනාකාරෙන, තස්මා සුඤ්ඤතො, අස්සාමිකතො, අවසවත්තිතො, අත්තපටිපක්ඛතො ච අනත්තාති"**

[එසේම යම්හෙයකින් උපන්නාවූ සංස්කාරයෝ ඨිතියට පැමිණෙත්වා ඨිතියට පැමිණි සංස්කාරයෝ ජරාවට නොයත්වා, ජරාවටගිය සංස්කාරයෝ නොබිඳෙත්වා යනුවෙන් මේ තුන් ස්ථානයන්හි කිසියම් තම වසඟයෙහි පවත්වන බවක් නැත. එබඳු වූ වසඟයෙහි පවත්වන බවකින් ස්කන්ධයෝ ශුන්‍ය හ. හිස් ය. එබැවින් සියලු සංස්කාර ධර්මයෝ ශුන්‍ය බවින් අස්වාමිකබවින් වසඟයෙහි නොපවත්වන්නා බැවින් ආත්ම ප්‍රතිපක්ෂ හෙයින් අනාත්මයහ. (විශුද්ධිමාර්ගය - හේ.මු. 464)]

මේ අනුව සංස්කාරයෝ වසඟයෙහි පවත්වන්නාවූ අයවළුන් නොමැති බැවින් ශුන්‍යහ. හිස් ය. සංස්කාරයන් තුළ ස්වාමීභාවයක් නැති හෙයින් නොහොත් දාසයන්ට ස්වාමියෙකු මෙන් සංස්කාරයන්ට ස්වාමීභාවයෙන් ක්‍රියාකරන සත්ත්‍වයකු පුද්ගලයෙකු නැති හෙයින් සංස්කාරයෝ

අස්වාමිකයහ. වසඟයෙහි පවත්වන සත්ත්වයකු පුද්ගලයෙකු නැති බැවිනි සංස්කාරයෝ අවශවර්තීහුය. එබැවින් සත්ත්ව පුද්ගල ආත්මභාවයනට ප්‍රතිපක්ෂ ශූන්‍ය අස්වාමික අවශ්වර්තික සියළු සංස්කාරයෝ අනාත්මයහ.

## III. ධම්මපදාර්ථකතාව

තවද ධම්මපදාර්ථකතාවෙහි මග්ග වග්ගයෙහි “සබ්බෙ ධම්මා අනත්තාති” යන ගාථාවට ලියන ලද විස්තර වර්ණනාවෙහි මෙසේ දැක්වේ,

- **“අනත්තාති ‘‘මා ජීයන්තු මා මීයන්තු’’ති වසෙ වත්තෙතුං න සක්කාති අවසවත්තනට්ඨෙන අත්තසුඤ්ඤා අස්සාමිකා අනිස්සරාති අත්ථො.”**

[අනත්තා යනු නො දිරාවා නො මියේවා යනුවෙන් වසඟයෙහි පැවැත්වීමට නොහැකිය යි අවසඟ පවත්වන අර්ථයෙන් ආත්ම ශූන්‍යයහ අස්වාමිකයහ අනීශ්වරයහ යන අර්ථයයි. (ධම්මපදට්ඨකථා 2 - හේ.මු. 540)]

පෙර කී ක්‍රමයෙන් වසඟයෙහි පැවැත්විය නොහැකි හෙයින් සත්ත්ව පුද්ගල ආත්ම ස්වභාවයන්ගෙන් ශූන්‍ය වූ සිස් වූ ස්වාමිභාව රහිතවූ සංස්කාරධර්මයෝ සර්වබලධාරී දෙවියකු මැවුම්කාර බ්‍රහ්මයකු සක්විති රජකු සෙස්සන්ට අධිපතිකම් ඊශ්වරකම් කරන්නා සේ අධිපතිබවත් ඊශ්වරබවත් කරන්නාවූ සත්ත්ව පුද්ගල ආත්ම ස්වභාවයන්ගෙන් යුක්ත නොවන හෙයින් අනාත්මය යන්න මෙයින් මතු කරයි.

මේ ආකාරයට පංචඋපාදානස්කන්ධ ධර්මයන් විවිධ ක්‍රමයෙන් අනාත්ම ලෙස දකින්නහුට මමය සත්ත්වයාය පුද්ගලයාය කියා දරන්නට කිසිවක් මේ තුළ නැතැයි යන අවබෝධයට පැමිණේ. මේ ඥාණ දර්ශණය ඒ පුද්ගලයාගේ ස්කන්ධ කෙරෙහි බැසගෙන ඇත්තාවූ විසිවැදැරුම් සක්කායදිට්ඨිය ප්‍රහාණයට හේතු වේ. මෙසේ ක්‍රමයෙන් ආත්ම දිට්ඨිය ක්‍ෂය වන්නා වූ තැනැත්තාට සංස්කාරයන්ගෙන් ඇති ශූන්‍යතාවය හිස්බව වැටහෙන්නට පටන්ගනී. සංස්කාරයන්ගේ හිස් බවත් ආදීනවයත් දකින්නහුට සංස්කාරයන් කෙරෙහි කලකිරීම හෙවත් නිබ්බිදාව උපදී. ඒ තැනැත්තාට ඉන්පසු සංස්කාරයන් කෙරෙන් මිදීමේ බලවත් කැමැත්තක් උපදී. ඒ බලවත් කැමැත්ත ඒ පුද්ගලයාට සංස්කාරයන්ගෙන් තොරවූ නිර්වාණය සාක්ෂාත් කර ගැනීමට හේතු වන්නේය.

**මෙතෙකින් ත්‍රිලක්ෂණය ගැන කළ සංක්ෂිප්ත විස්තරය අවසන් වන්නේය. කියන ලද ක්‍රමයෙන් ත්‍රිලක්ෂණයට නංවමින් නාම-රූප සම්මර්ශනය කරමින් නිවන් මාර්ගය වඩන ආකාරය භාග්‍යවතුන්වහන්සේ විසින් විවිධ සූත්‍රවල දේශනා කොට වදාළ ආකාරය මීළඟ ලිපියෙන් විස්තර කරන්නෙමු.**

## 7. සූත්‍ර දේශනා තුළින් නිවන් මග

**පසුගිය ලිපිවලින් අපි ත්‍රිපිටක පෙළ අර්ථ කථා ටීකාවන්හි ත්‍රිලක්ෂණයන් සඳහා ලබාදුන් අර්ථකථනයන් පිළිබඳව විස්තර කළෙමු. එකී ත්‍රිලක්ෂණ අර්ථයන්ම යොදාගෙන විපස්සනාව කිරීම භාග්‍යවතුන් වහන්සේගේ අභිප්‍රාය වූ බව මේ ලිපියෙන් විස්තර කරන්නෙමු.**

### I. දීඝ නිකාය මහා නිධාන සූත්‍රය

දීඝ නිකායේ මහා නිධාන සූත්‍රයෙහි භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

‘‘සුඛාපි ඛො, ආනන්ද, වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා. දුක්ඛාපි ඛො, ආනන්ද, වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා. අදුක්ඛමසුඛාපි ඛො, ආනන්ද, වෙදනා අනිච්චා සඞ්ඛතා පටිච්චසමුප්පන්නා ඛයධම්මා වයධම්මා විරාගධම්මා නිරොධධම්මා. තස්ස සුඛං වෙදනං වෙදයමානස්ස ‘එසො මෙ අත්තා’ති හොති. තස්සායෙව සුඛාය වෙදනාය නිරොධා ‘ව්‍යග්ගො මෙ අත්තා’ති හොති. දුක්ඛං වෙදනං වෙදයමානස්ස ‘එසො මෙ අත්තා’ති හොති. තස්සායෙව දුක්ඛාය වෙදනාය නිරොධා ‘ව්‍යග්ගො මෙ අත්තා’ති හොති. අදුක්ඛමසුඛං වෙදනං වෙදයමානස්ස ‘එසො මෙ අත්තා’ති හොති. තස්සායෙව අදුක්ඛමසුඛාය වෙදනාය නිරොධා ‘ව්‍යග්ගො මෙ අත්තා’ති හොති. ඉති සො දිට්ඨෙව ධම්මෙ අනිච්චං සුඛං දුක්ඛං වොකිණ්ණං උප්පාදවයධම්මං අත්තානං සමනුපස්සමානො සමනුපස්සති, යො සො එවමාහ – ‘වෙදනා මෙ අත්තා’ති. තස්මාතිහානන්ද, එතෙන පෙතං නක්ඛමති – ‘වෙදනා මෙ අත්තා’ති සමනුපස්සිතුං.

‘තත්‍රානන්ද , යො සො එවමාහ ‘න හෙව ඛො මෙ වෙදනා අත්තා, අප්පටිසංවෙදනො මෙ අත්තා’ති, සො එවමස්ස වචනීයො ‘යත්ථ පනාවුසො, සබ්බසො වෙදයිතං නත්ථි අපි නු ඛො තත්ථ ‘‘අයමහමස්මී’’ති සියා’’’ති?

‘‘නො හෙතං, භන්තෙ’’.

‘‘තස්මාතිහානන්ද, එතෙන පෙතං නක්ඛමති ‘න හෙව ඛො මෙ වෙදනා අත්තා, අප්පටිසංවෙදනො මෙ අත්තා’ති සමනුපස්සිතුං.

‘තත්‍රානන්ද , යො සො එවමාහ ‘න හෙව ඛො මෙ වෙදනා අත්තා, නො'පි අප්පටිසංවෙදනො මෙ අත්තා, අත්තා මෙ වෙදයති, වෙදනා ධම්මො හි මෙ අත්තා'ති, සො එවමස්ස වචනීයො 'වෙදනා ච හි ආවුසො සබ්බෙන සබ්බං සබ්බථා සබ්බං අපරිසෙසා නිරුජ්ඣෙය්‍යුං, සබ්බසො වෙදනාය අසති වෙදනා නිරොධො අපි නු ඛො තත්ථ අයමහමස්මීති සියා?' ති.

‘‘නො හෙතං, භන්තෙ’’.

‘‘තස්මාතිහානන්ද, එතෙන පෙතං නක්ඛමති ‘න හෙව ඛො මෙ වෙදනා අත්තා, නො'පි අප්පටිසංවෙදනො මෙ අත්තා, අත්තා මෙ වෙදයති, වෙදනා ධම්මො හි මෙ අත්තා'ති සමනුපස්සිතුං.’’

‘‘යතො ඛො, පනානන්ද, භික්ඛු නෙව වෙදනං අත්තානං සමනුපස්සති, නොපි අප්පටිසංවෙදනං අත්තානං සමනුපස්සති, නොපි ‘අත්තා මෙ වෙදයති, වෙදනාධම්මො හි මෙ අත්තා’ති සමනුපස්සති.

සො එවං අසමනුපස්සන්තො න ච කිඤ්චි ලොකෙ උපාදියති, අනුපාදියං න පරිතස්සති, අපරිතස්සං පච්චත්තතං යෙව පරිනිබ්බායිස්සති. 'ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා'ති පජානාති.

<u>සිංහල අර්ථය</u>

*ආනන්දය, සුඛවේදනාව ද අනිත්‍ය ය, සංස්කෘත ය (ප්‍රත්‍යයයන් විසින් සකස් වූයේ ය), ප්‍රතීත්‍යසමුත්පන්න ය, ක්ෂයධර්මය (ක්ෂීණ වන සුලු ය), ව්‍යධර්මය, (වැනසෙන සුලු ය), විරාගධර්ම ය (පහ වන සුලු ය), නිරෝධධර්මය (නිරුද්ධවන සුලු ය). ආනන්දය, දුඃඛවේදනාව ද අනිත්‍ය ය, සංස්කෘත ය. ප්‍රතීත්‍යසමුත්පන්න ය, ක්ෂයධර්මය, ව්‍යධර්මය, විරාගධර්ම ය, නිරෝධධර්මය. ආනන්දය, අදුඃඛාසුඛවේදනාව ද අනිත්‍ය ය, සංස්කෘත ය, ප්‍රතීත්‍යසමුත්පන්න ය, ක්ෂයධර්මය, ව්‍යධර්මය, විරාගධර්ම ය, නිරෝධධර්මය. සුඛවේදනාව විඳුනා හට 'මේ මගේ ආත්මය වේ' යැ යි සිතෙක් වෙයි. ඒ සුඛවේදනාවගේ නිරෝධයෙන් 'මේ මගේ ආත්මය ව්‍යග්‍ර වී (විසිර ගියේ යැ යි, පහ ව ගියේ යැ)' යි සිතෙක් වෙයි. දුඃඛවේදනාව විඳුනාහට 'මේ මගේ ආත්මය වේ ' යැ යි සිතෙක් වෙයි. ඒ දුඃඛවේදනාවගේ ම නිරෝධයෙන් 'මගේ ආත්මය ව්‍යග්‍ර වී' යැ යි සිතෙක් වෙයි. අදුඃඛාසුඛවේදනාව විඳුනාහට 'මේ මගේ ආත්මය යැ' යි සිතෙක් වෙයි. ඒ අදුඃඛාසුඛවේදනාව නිරුද්ධ වීමෙන් 'මගේ ආත්මය ව්‍යග්‍ර වී යැ' යි සිතෙක් වෙයි. මෙසේ හෙ තෙම මෙ අත්බව්හි ම ආත්මයක් දක්නේ අනිත්‍ය වූ සුඛ වූ දුක් වූ අනිත්‍යාදී ලක්ෂණයන්ගෙන් මිශ්‍ර වූ (අදුඃඛාසුඛ වූ) උපදනසුලු නැසෙන සුලු රූපාදි ස්කන්ධයක් දකී. එහෙයින් ආනන්දය, 'වේදනාව මගේ ආත්මයැ' යි මෙය දක්නට මෙයිනුත් නො රිසියෙයි.*

*ආනන්දය, ඔවුන් අතුරෙන් යමෙක් 'වේදනාව මගේ ආත්මය නොවේ ම ය, මගේ ආත්මය ප්‍රතිසංවේදනා රහිත යැ' යි මෙසේ කියා නම්, 'ඇවැත්නි, යම් තැනෙක හැම අයුරින් ම විඳීමෙක් නැත් නම්, එහි මේ මම වෙමි' යි කියැ යුතු කිසි ස්කන්ධධර්මයෙක් වන්නේ දැ?' යි හෙ තෙම කිය යුතු. (ඔහුගෙන් ප්‍රශ්න කළ යුතු).*

*"වහන්ස, මෙය (මම වෙමි යි ගත යුතු කිසි ස්කන්ධයෙක් එහි) නොවේ ම යැ" යි (අනඳතෙරණුවෝ වාදාළහ.)*

*"ආනන්දය, එහෙයින් 'වේදනාව මගේ ආත්මය නොවේ ම ය, මගේ ආත්මය ප්‍රතිසංවේදනාරහිත යැ'යි මෙය දක්නට මෙයිනුත් නො රිසියෙ යි."*

*"ආනන්දය, ඔවුන් අතුරෙන් යමෙක් 'වේදනාව මගේ ආත්මය නො වේ ම ය, මගේ ආත්මය වේදනාරහිතත් නො වේ ම ය, මගේ ආත්මය විඳියි, මගේ ආත්මය විඳින සුලු යැ' යි යමෙක් මෙසේ කියා නම්, 'ඇවැත්නි, වේදනාවෝත් හැම අයුරින් ම හැම සැටියෙන් ම නො ඉතිරි ව නිරුද්ධ වන්නාහු නම්, හැම අයුරින් ම වේදනාව නැති කල්හි, වේදනාවගේ නිරෝධයෙන් එහි 'මේ මම වෙමි' යි කියා යුතු කිසිදු ස්කන්ධධර්මයෙක් වන්නේ දැ?යි මෙසේ හෙ තෙම කියැ යුතු (ඔහුගෙන් ප්‍රශ්න කළයුතු). "වහන්ස, ('මේ මම වෙමි'යි කිය යුතු කිසිත් වන්නේ ය යන) මෙය නො වේ ම ය." ආනන්දය,*

*එහෙයින් මෙයිනුත් වේදනාව මගේ ආත්මය නොවේ ම ය, වේදනා නො වනුයේත් මගේ ආත්මය නො වේ ම ය, (වේදනායෙන් අන්‍ය ධර්මයෙක් වූ) මගේ ආත්මය විඳියි, (එසේ වූ) මගේ ආත්මය විඳින සුලු යැ' යි මෙසේ මෙය දක්නට නො රිසියෙයි.*

*''ආනන්දය, යම් කලෙක මහණ වේදනාව ආත්ම කොට නො දකී ද, ආත්මය වේදනා නොවූවක් කොට හෝ නො දකී ද, 'මගේ ආත්මය විඳියි, මගේ ආත්මය විඳුනා සුලු යැ'යි හෝ නො ම දකී ද, එසේ නො දක්නා හෙ තෙම ලොවැ කිසිත් (ආත්ම ආත්මීය වශයෙන්) නො ගනුයේ තෘෂ්ණා දෘෂ්ටි මාන යන තුන් පරිතස්සනායෙන් පරිතස්සනා නො කෙරෙයි. පරිතස්සනා නො කරන්නේ තෙමේ ම කෙලෙස් පිරිනිවනින් පිරිනිවෙයි, 'සසර ඉපැත්ම ක්ෂීන වීයැ යි, මග බඹසර වැස නිමැවිණැ යි, කළ යුතු දැ කරන ලද්දේ යැ යි, මේ රහත් බව පිණිස කළයුතු අනෙකක් නැතැ' යි දැනගනී.*

(දීඝනිකාය 2 - මහාවග්ගය - මහානිදාන සූත්‍රය - බු.ජ.මු. 100, 102)

***භාග්‍යවතුන් වහන්සේ මෙහිලා පළමුව සුඛ, දුක්ඛ අදුක්ඛමසුඛ වේදනාවන් ධර්මතාවන් බව ඛය ධම්ම, වය ධම්ම ආදී පදයන්ගේ 'ධම්ම' යන පදයෙන් වදාළසේක.***

ධම්ම යන පදයේ අර්ථය ධම්මසංගණීප්පකරණ අර්ථකථාවෙහි මෙසේ දක්වයි.

**"අත්තනෝ පන සභාවං ධාරෙන්තීති ධම්මා, ධාරියාති වා පච්චයෙහි ධාරීයන්ති වා යථාසවභාවතො ති ධම්මා"**

[තමන්ගේ ස්වභාවලක්ෂණය දරන්නේනුයි ධම්ම වේ. තවද තෙමේම දරන්නෙනුයි හෝ ප්‍රත්‍යයන්ගෙන් දරන්නේනුයි හෝ පවතින ස්වභාව ලක්ෂණවශයෙනුයි ධම්මා වේ" (ධම්මසංගණීප්පකරණ අ.ක. හේ.මු. 63)]

මේ අනුව ධම්ම යනු ස්වභාව ලක්ෂණ මාත්‍රයෝය. අර්ථකථාවෙහි තවදුරටත් නිස්සත්ත නිජ්ජීව හෙයින්ද 'ධම්ම' යයි ද දක්වයි. එබැවින් මෙහි ත්‍රිවිධ වේදනාවෝ ධර්මතා වශයෙන්ම වදාළ බැව් දතයුතුය. ත්‍රිවිධ වේදනා හා සම්ප්‍රයුක්ත අනෙකුත් නාම ධර්මයෝ ද ඒ නාම ධර්මයන්ට උප්පත්ති ස්ථාන වූ කයෙහි රූප ධර්මයෝ ද ත්‍රිවිධ වේදනාවන් වදාළ කල්හි වදාළාහුම වෙත්. මෙලෙස මේ සියළු නාම රූප ධර්ම ධර්මතා ලෙසම නොහොත් ස්වභාව ලක්ෂණ ලෙසම වදාරණ ලද්දේ වෙයි.

එකී ත්‍රිවිධ වේදනාවෝ සංඛතය පටිච්චසමුප්පන්න යැයි වදාළ බැවින් ඒ ධර්මයෝ ද ඒ හා උපන් නාමයෝ ද ඇසුරු කරගත් රූපයෝ ද සංඛතය පටිච්චසමුප්පන්න යැයි වදාළේම වෙත්. එයින් ඒ සියලු ධර්ම ප්‍රත්‍යයන්ගෙන් උපදින බව දක්වයි.

ත්‍රිවිධ වේදනාවෝ අනිච්චා, ඛයධම්මා, වයධම්මා, විරාගධම්මා, නිරෝධධම්මා යැයි වදාළ බැවින් **"යන්නිච්චං තං දුක්ඛං යංදුක්ඛං තදනත්තා"** (යමක් අනිත්‍ය වේද එය දුකය. යමක් දුක් වේද එය අනාත්මයය) යන පාලියට අනුව ත්‍රිවිධ වේදනාවන්ගේම අනිච්ච, දුක්ඛ, අනාත්ම වදාළේම වෙත්.එබැවින් ඒ වේදනාවෝද එක්ව උපන් නාමයෝද ඇසුරු කර ගත් රූපයෝද අනිච්ච, දුක්ඛ, අනාත්ම බැව් වදාළේම වෙත්.

භාග්‍යවතුන් වහන්සේ ත්‍රිවිධ වේදනාවන් කරණය කොට සියලු නාමරූප ධර්මයන්ගේ ත්‍රිලක්ෂණයෙන් යුක්ත බව වදාරා ඉන් අනතුරුව **"තස්ස සුඛං වෙදනං වෙදයමානස්ස එසො මෙ අත්තාති හොති "** යනුවෙන් වදාරමින් ඒ වේදනාව කෙරෙහි " වේදනාව මාගේ ආත්මය" යැයි ආත්ම දෘෂ්ටිය හෙවත් සක්කාය දෘෂ්ටිය ඇතිවන ආකාරය දක්වයි. මෙලෙස විද්‍යාමාන වන්නා වූ අනිත්‍ය දුක්ඛ අනාත්ම වූ වේදනාව කෙරෙහි විද්‍යාමාන නොවන්නා වූ හෙවත් සැබැවින් ම නැත්තා වූ ආත්ම හැඟීමක් සත්වයෙක් ඇත පුද්ගලයෙක් ඇත මමෙක් ඇත යන වැරදි හැඟීමක් නොහොත් ආත්ම දෘෂ්ටියක් ඇති වන බව "වේදනාව මාගේ ආත්මය යැයි ගන්නේය" යන්නෙන් වදාරන ලද්දේ වෙයි.

මීළඟට වේදනාව නිරුද්ධ වන කල්හි **"ව්‍යග්ගෝ මෙ අත්තා"** (මාගේ ආත්මය විසිරුණේය) යැයි සිතෙන බව කීමෙන් මෙතුවක් වෙලා වේදනාව කෙරෙහි තිබූ ආත්ම දෘෂ්ටිය වෙනත් ස්කන්ධයක් කෙරෙහි ඇතිවන බව දක්වයි.

එසේ ත්‍රිවිධ වේදනාවට ම කරුණු දක්වා **"ඉති සො දිට්ඨෙව ධම්මෙ අනිච්චං සුඛං දුක්ඛං වොකිණ්ණං ....."**යනාදී වශයෙන් මෙසේ මේ පුද්ගලයා අනිත්‍ය සුඛ දුක්ඛ ආදී ලක්ෂණයන්ගෙන් මිශ්‍ර වූ ඉපදෙන බිඳෙන ස්වභාවය ඇත්තාවූ මේ වේදනාව ආත්මය ලෙස ගන්නා බව වදාරන ලද්දේය. තවදුරටත් භාග්‍යවතුන් වහන්සේ "ආනන්දයෙනි, මෙබඳු වූ අනිත්‍ය ආදීන් ගෙන් යුක්ත වූ වේදනාව ආත්ම වශයෙන් ගන්නට නුසුදුසු" යැයි වදාරයි.

ඉදින් ඒ පුද්ගල තෙමේ ආත්ම දෘෂ්ටිය රූපස්කන්ධය කෙරෙහි බැසගත් විට "වේදනාව මාගේ ආත්මය නොවේ, මාගේ ආත්මය විඳින ස්වභාවයෙන් තොර" යැයි කියා නම් ඒ විඳීම් ස්වභාවය රහිත වූ අනිත්‍යාදී ලක්ෂණවලින් යුක්ත වූ රූප ස්කන්ධය කෙරෙහි, වේදනාවේ බැසගත්තා මෙන්ම ආත්ම දෘෂ්ටියෙන් බැසගෙන "එහි මම වෙමි" යයි කීමට සුදුසු දැයි ප්‍රශ්න කළ යුතු යැයි භාග්‍යවතුන් වහන්සේ වදාරයි. ආනන්ද හිමි එයට නුසුදුසු යැයි පිළිතුරු දෙයි.

භාග්‍යවතුන් වහන්සේ නැවතත් ඒ පුද්ගල තෙමේ රූප, වේදනා හැර සෙසු ඛන්ධත්‍රය කෙරෙහි ආත්ම දෘෂ්ටියෙන් බැසගෙන "වේදනාව මගේ ආත්මයද නොවේ, මගේ ආත්මය වේදනා විඳීම් රහිතයෙක්ද නොවේ. මම වේදනා විඳින සුළු වෙමි යනාදී වශයෙන් කියයි නම්, වේදනාව නිරුද්ධ වන විට සෙසු ඛන්ධත්‍රයද නිරුද්ධ වන බැවින්, වේදනාව නිරුද්ධ වන විට "මම එහි වෙමි" යි කීමට සුදුසු දැයි ප්‍රශ්න කළ යුතු යැයි වදාරණ සේක. ආනන්ද හිමි එයටද නුසුදුසු යැයි පිළිතුරු දෙයි.
අවසානයෙහිදී භාග්‍යවතුන් වහන්සේ යමෙක් (වේදනාව ආත්මය ලෙස ගෙන) වේදනාව මගේ ආත්මය යැයි ද (රූපය ආත්මය ලෙස ගෙන) මගේ ආත්මය වේදනා නොවිඳින්නෙක් යැයි ද (සෙසු ඛන්ධත්‍රය ආත්ම ලෙස ගෙන) මගේ ආත්මය වේදනා විඳින සුල්ලෙක් යැයි ද යන තුන් තන්හි ආත්ම වශයෙන් බැස නොගන්නේ නම් මේ ලෝකයේ කිසිවක් උපාදානය නොකර කෙලෙස් පිරිනිවීමෙන් පිරිනිවෙන බව දේශනා කළ සේක.

ඉහතින් දක්වන ලද මහානිදාන සූත්‍ර පාඨයේ අර්ථය කෙටියෙන් දැක්වූයේ සූත්‍රය තුළින් ථේරවාදී විපස්සනා භාවනා ක්‍රමය මතු කර දැක්වීමයටය.

එහි පළමුව ත්‍රිවිධ වේදනාදී නාමරූප ධර්ම ධර්මතා මාත්‍ර බව දැක්වීමෙන්
★ නාමරූප පරිග්‍රහණය දක්වා වදාළ සේක.

දෙවනුව නාමරූපයෝ ප්‍රත්‍යයන්ගෙන් උපදින බව දැක්වීමෙන්
★ ප්‍රත්‍ය පරිග්‍රහණය දක්වා වදාළ සේක.

නාමරූප ධර්මයෝ ත්‍රිලක්ෂණයන්ගෙන් යුක්ත බව දැක්වීමෙන්
★ සම්මසනඤාණයේ සිට ඉදිරි නව මහා විදර්ශනාඤාණ දක්වන ලදී.

## II. සංයුක්ත නිකාය - භූත සූත්‍රය

තවද මේ ත්‍රිලක්ෂණ අර්ථ සහිත විපස්සනා පිළිවෙළ ත්‍රිපිටකය පුරාවට සූත්‍ර දේශනාවල යෙදී ඇති අතර සංයුක්ත නිකායෙහි භූත සූත්‍රයෙහි මෙසේ දැක්වේ.

"කථඤ්ච, භන්තෙ, සඞ්ඛාතධම්මො හොති? භූතමිදන්ති, භන්තෙ, යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. භූතමිදන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා භූතස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති. තදාහාරසම්භවන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. තදාහාරසම්භවන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා ආහාරසම්භවස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති. තදාහාරනිරොධා යං භූතං තං නිරොධධම්මන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය පස්සති. තදාහාරනිරොධා යං භූතං තං නිරොධධම්මන්ති යථාභූතං සම්මප්පඤ්ඤාය දිස්වා නිරොධධම්මස්ස නිබ්බිදා විරාගා නිරොධා අනුපාදා විමුත්තො හොති. එවං ඛො, භන්තෙ, සඞ්ඛාතධම්මො හොති.

*සිංහල අර්ථය*

*වහන්ස, කෙසේ නම් දන්නා ලද දහම් ඇත්තේ වේ ද? වහන්ස, මේ ස්කන්ධපඤ්චකය යි තතුසේ මනා නුවණින් දකී. මේ ස්කන්ධපඤ්චකය තතුසේ මනා නුවණින් දැක ස්කන්ධපඤ්චකය පිළිබඳ කළකිරීමෙන් නො ඇලීමෙන් නිරොධයෙන් උපාදාන විසින් නො ගෙණ මිදුනේ වේ තෙල ස්කන්ධපඤ්චකය ආහාරයෙන් හටගත්තේ ය යි තතු සේ මනා නුවණින් දකී. එය ආහාරයෙන් හටගත්තේ යයි තතු සේ මනා නුවණින් දැක ආහාරයෙන් හටගත් පඤ්චස්කන්ධය පිළිබඳ කළකිරීමෙන් නො ඇලීමෙන් නිරෝධයෙන් උපාදාන විසින් නො ගෙණ මිදුනේ වේ. ඒ ආහාර නිරෝධයෙන් - යමක් හටගත්තේ ද එය නිරෝධ ස්වභාව කොට ඇත්තේ ය යි තතු සේ මනා නුවණින් දකී. ඒ ආහාර නිරෝධයෙන් - යමක් හටගත්තේද එය නිරෝධ ස්වභාව කොට ඇත්තේ ය යි තතු සේ මනානුවණින් දැක නිරෝධ ස්වභාව කොට ඇති ස්කන්ධපඤ්චකය පිළිබඳ කළකිරීමෙන් නො ඇලීමෙන් නිරෝධයෙන් උපාදාන විසින් නො ගෙණ මිදුනේ වේ. වහන්ස, මෙසේ දන්නා ලද දහම් ඇත්තේ වේ. (මෙයින් රහත්හුගේ පිළිවෙත කියූ.)* ( සංයුක්ත නිකාය II - අභිසමය සංයුක්තය - භූත සූත්‍රය - බු.ජ.මු. 76)

භාග්‍යවතුන් වහන්සේ විසින් පාරායන වර්ගය අජිත ප්‍රශ්නයෙහි ගාථාවකින් පැනයක් අසන ලදුව භාග්‍යවතුන් වහන්සේගෙන් ම න්‍යාය ගත් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ විසින් පැන විසඳාලීම් වශයෙන් මෙම සූත්‍ර කොටස දේශනා කොට වදාරන ලදී. ඒහිදී භාග්‍යවතුන් වහන්සේ ශෛක්‍ෂ අශෛක්‍ෂ ප්‍රතිපදාව අසා වදාළ සේක. එයින් අශෛක්‍ෂ ප්‍රතිපදාව දැක්වීම් වශයෙන් සාරිපුත්ත ස්වාමීන් වහන්සේ මේ සූත්‍ර කොටස දේශනා කළ සේක.

**එහිදී සාරිපුත්ත ස්වාමීන් වහන්සේ පුද්ගලයා යනු භූත හෙවත් ස්කන්ධ පංචකයක් හෙවත් රූප වේදනා සංඥා සංඛාර විඥානය යි වදාළ සේක. ඒ තුළින් සත්ත්වයා යනු නාම-රූප බව දැක්වූ සේක.**

- **එයින් නාම-රූප පරිග්‍රහණය වදාළේය.**

**ඒ ස්කන්ධ පංචකය සතර වැදෑරුම් ආහාරයන් හෙවත් කබලිංකාකාර ආහාර, ඵස්සාහාර, මනෝසඤ්චේතනා ආහාර, විඥාන ආහාර යන්ගෙන් හටගත් බව වදාළ සේක.**

- **ඒයින් ප්‍රත්‍ය පරිග්‍රහණය වදාළ සේක.**

**ඉන්පසු ඒ ආහාර නිරෝධයෙන් යම් ස්කන්ධපඤ්චක භූතයෙක් වේද එය ස්කන්ධ පඤ්චකය නිරවශේෂ නිරෝධයට යන්නේ යයි වදාළ සේක. මෙසේ ස්කන්ධ නිරවශේෂ නිරෝධ වන බව දේශනා කිරීමෙන් ස්කන්ධයන්ගේ අනිත්‍ය ලක්ෂණය දේශනා කරන බව දත යුතුය. අනිත්‍ය ලක්ෂණය දේශනා කිරීමෙන් අනිත්‍ය ලක්ෂණය පදනම් කොට ගත් දුක්ඛ අනාත්ම ලක්ෂණයන්ද දේශනා කළ බව දත යුතුය.**

- **මෙසේ අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණය දේශනා කිරීමෙන් සම්මර්ශන ඥානයේ පටන් නව මහාවිදර්ශනා ඥානයන්ම දේශනා කළ බව දත යුතුය. ඒ සම්මර්ශන ඥානය ම පදනම් කොට ගෙන ඉතිරි නව මහාවිදර්ශනා ඥාන උපදින බැවිනි.**

**මෙසේ මේ භූත සූත්‍රය ඇසුරින් ධම්මසේනාධිපතීන් වහන්සේ විසින් ථේරවාදී විපස්සනා ප්‍රතිපදාව දේශනා කළ බව නුවණැත්තෝ දත යුතුත්තාහ. නැවත භාග්‍යවතුන් වහන්සේ විසින් සාරිපුත්තයන් වහන්සේගේ භාෂිතය අනුමෝදන් වීමෙන් ථේරවාදී විපස්සනා ප්‍රතිපදාව ශ්‍රී මුඛ බුද්ධ දේශනාව බවට පත්කළ බවද නුවණැත්තෝ දත යුත්තාහ.**

මෙතුවක් මේ කාරණා ගෙන හැර දැක්වූයේ පෙර ලිපිවලින් දැක්වූ අර්ථවලින් යුක්ත අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ත්‍රිලක්ෂණ වැඩීමෙන්ම පමණක් නිවන් සාක්ෂාත් කළ හැකි බවත්, භාග්‍යවතුන් වහන්සේගේ අභිප්‍රාය වූයේ ත්‍රිලක්ෂණයන් එකී අර්ථ වලින් යොදා ගෙන සම්මර්ශණය කිරීම මඟින් නිවන් අවබෝධ කරවීම බවත් පහදා දීමටය. එබැවින් නුවණැත්තෝ පෙර දක්වන ලද අර්ථ යොදා ගෙන ත්‍රිලක්ෂණ භාවනා වඩා නිවන් සාක්ෂාත් කර ගනිත්වා.

**මෙකී ත්‍රිලක්ෂණ අර්ථයන් සප්ත විශුද්ධියෙහි හා සතර මහ අපදේශයන්හි බහාලා අර්ථ මතු කර ගැනීම මීළඟ ලිපියෙන් දක්වන්නෙමු.**

## 8. සප්ත විශුද්ධිය හා සතර මහාපදේශ තුළින් ත්‍රිලක්ෂණය

### I. ථේරවාදී විපස්සනා ප්‍රතිපදාව - සප්ත විශුද්ධිය

**පසුගිය ලිපිවලින් අපි ත්‍රිපිටක පෙළ අටුවා ටීකාවන්ට අනුව ත්‍රිලක්ෂණයන්ගේ අර්ථ කෙබඳුද යන්නත් එකී ත්‍රිලක්ෂණ අර්ථයන් යොදාගෙන වර්ථමාන ථේරීය ඇදුරන් විපස්සනාව පුහුණු කරන ආකාරයද, ත්‍රිලක්ෂණයන් සඳහා එකී අර්ථයන් යොදා ගැනීම සූත්‍ර දේශනාවලට අනුව භාග්‍යවතුන් වහන්සේගේ අභිප්‍රාය වූ බවද විස්තර කළෙමු. මේ ලිපි මාලාවේ අවසන් ලිපිය වශයෙන් මෙහි එකී ත්‍රිලක්ෂණ අර්ථයන් සප්ත විශුද්ධියෙහි හා සතර මහා අපදේශයන්හි බහා ත්‍රිලක්ෂණය පිළිබඳව සුගතවාදය වූයේද ථේරවාදී මහාවිහාර මතය වූයේද මෙම අර්ථයන්ම බව මතු කර දක්වන්නෙමු.**

සප්ත විශුද්ධිය පිළිබඳ න්‍යාය පෙළ දේශනාවෙහි සඳහන් වනුයේ මජ්ඣිම නිකායේ රථවිනීත සූත්‍රයෙහි ය. සාරිපුත්ත මහරහතන් වහන්සේ හා පුණ්ණ මන්තානි පුත්ත මහරහතන් වහන්සේ අතර වූ ධර්ම සංවාදයේදී පුණ්ණ ස්වාමීන් වහන්සේ විසින් මේ සප්ත විසුද්ධිය ගෙනහැර දක්වන ලදී. ථෙරවාදීන්ගේ භාවනා ග්‍රන්ථ අතුරින් ශ්‍රේෂ්ඨත්වයට පැමිණි විශුද්ධි මාර්ගය ලියවුනේ මේ සප්ත විශුද්ධිය පදනම් කරගෙනය. මේ සප්ත විශුද්ධි නිවන් මාර්ගය තුලද යෙදෙන්නේ ඉහත දක්වන ලද ත්‍රිලක්ෂණ අර්ථම බව මෙසේ පැහැදිලි කළ හැක.

මෙහිදී විශුද්ධි මාර්ගයෙහි මග්ගාමග්ග ඥාණ දර්ශනයෙහි පටන් ත්‍රිලක්ෂණය විස්තර කෙරෙන ස්ථානයන්හි පාළි පාඨ දක්වමින් සඳහන් කළේද මේ ත්‍රිලක්ෂණ අර්ථයන්ම බව පැහැදිලි කළ හැක. එය දැනගැනීමට කැමති භවත්හු විශුද්ධි මාර්ගය බලත්වා.

මෙහිදී අපි වෙනත් ක්‍රමයක් අනුගමනය කරන්නෙමු. පෙර ලිපියෙන් අපි මහා නිධාන සූත්‍රයෙහි හා භූත සූත්‍රයෙහි කියැවෙනුයේද අප විස්තර කරන ලද ත්‍රිලක්ෂණ අර්ථයන්ම බව පැහැදිලි කළෙමු. එසේම එම සූත්‍ර තුළ නාම රූප පරිග්‍රහණය, ප්‍රත්‍යය පරිග්‍රහණය හා ත්‍රිලක්ෂණ සම්මර්ශනය ඇති බව පැහැදිලි කළෙමු. එකී තුන් පියවරකින් යුත් ප්‍රතිපදාව තුළ සප්ත විශුද්ධිය ගැබ්ව ඇති බව මෙහිදී අපි පැහැදිලි කරන්නෙමු. එමගින් සප්ත විශුද්ධිය තුළද ගැබ්ව ඇත්තේ දක්වන ලද ත්‍රිලක්ෂණ අර්ථයන්ම බව පැහැදිලි වන්නේය.

සෑම යෝගාවචරයකු විසින්ම ශීලයක පිහිටා නීවරණ යටපත් කරගෙන විපස්සනාව ඇරඹිය යුතුය. ඒ බැව් **“ සීලේ පතිට්ඨාය නරෝ සපඤ්ඤෝ චිත්තං පඤ්ඤංච භාවයං ( ත්‍රිහේතුක ප්‍රතිසන්ධියක් ලැබූ ප්‍රඥාව සහිත යෝගාවචර තෙමේ ශීලයෙහි පිහිටා සමථය නම් චිත්තය ද විපස්සනාව නම් ප්‍රඥාව ද වඩයි. )”** යන සුප්‍රසිද්ධ ගාථා පාඨයෙන් දැක්වේ.

**ඒබැවින් ඉහත ගාථා පාඨයෙන්,**

1. ශීල විසුද්ධිය
2. චිත්ත විසුද්ධිය

යන විශුද්ධීන් ථේරවාදී විපස්සනා ප්‍රතිපදාවට පළමු කොටම ඇතුලත්වේ.

ඒ විශුද්ධි දෙක පසුගිය ලිපියෙහි දැක්වූ මහා නිදාන, භූත යන සූත්‍ර දෙකින් මතුකරගත් ප්‍රතිපදාවෙහි සෘජුවම නොකියැවෙන්නේ වුවද එහි පූර්වයෙහි ද ඇති බව දත යුතුය. ඒ සූත්‍ර දෙකින් ම මතු කළ නාම රූප පරිග්‍රහණය යනු,

3. දිට්ඨි විසුද්ධිය

බව දත යුතුය.

එසේම ඉන් අනතුරුව එම සූත්‍ර තුළ දක්වන ලද ප්‍රත්‍ය පරිග්‍රහය යනු,

4. කංඛාවිතරණ විසුද්ධිය

බව දත යුතුය.

ඉන් අනතුරුව එහි දක්වන ලද ත්‍රිලක්ෂණ සම්මර්ශන මගින්, විවිධ විවිධ නයින් වඩන ලද ත්‍රිලක්ෂණ සම්මර්ශනයෙන් ඉදිරි විසුද්ධීහු දැක්වූ බව දත යුතුය. එහිදී රූප සත්තක අරූප සත්තක චත්තාළීසාකාර යනාදි නයින් ත්‍රිලක්ෂණය සම්මශීණය කොට දසවිධ විදර්ශනා උපක්ලේශ දුරුකොට තරුණ උදයවැය දර්ශනය ලබා ගැනීම

5. මග්ගාමග්ගඤාණදස්සන විසුද්ධිය

බව දත යුතුය. ඉන් අනතුරුව සංස්කාරයන්ගේ හටගැනීමට හේතු වන ප්‍රත්‍ය ධර්ම සතර ද උදය ලක්ෂණය ද ස්කන්ධයන්ට නංවමින් සම්මර්ශනය කරයි. එසේම ප්‍රත්‍ය ධර්ම සතර ද වය ලක්ෂණයද ස්කන්ධයන්ට නංවමින් සම්මර්ශනය කරයි. ඉන් අනතුරුව ප්‍රත්‍ය වශයෙන් සම්මර්ශනය නවතා ස්කන්ධයන්ගේ උදය වැය පමණක් බලමින් සම්මර්ශනය කරයි. මෙයින් ශක්තිමත් උදය වැය දර්ශනයත් සමඟ බලවත් උදය වැය ඥානයක් උපදී.ඉන් අනතුරුව අනෙකුත් ඉදිරි විපස්සනාඤාණ උදෙසා සුදුසු භාවනා වාක්‍ය යොදාගෙන සම්මර්ශනය කරන අතරතුර නැවත නැවතත් ස්කන්ධයන්ගේ ත්‍රිලක්ෂණයන්ම සම්මර්ශනය කරයි. මෙසේ උදය වැය භංගානුපස්සනා, භයතුපට්ඨාන, ආදීනව, නිබ්බිදා, මුංචිතුකම්‍යතා, පටිසංඛානුපස්සනා, සංඛාරඋපෙක්ඛා, ගෝත්‍රභූ, දක්වා නව මහා විදර්ශනා ඥාන වැඩීම

6. පටිපදා ඤාණ දර්ශන විශුද්ධිය බව දත යුතුය.

අවසානයේ ගෝත්‍රභූ ඥානයට අනතුරුව උපදින සෝවාන් ආදී ආර්යමාර්ග

7. ඤාණ දස්සන විසුද්ධිය වේ.

මේ අනුව ඉහත මහා නිධාන ආදී සූත්‍රවල දක්වන ලෙද ත්‍රිලක්ෂණ සම්මර්ශනයෙන් ප්‍රකාශ වනුයේ මග්ගාමග්ග ඥාණ දර්ශන විශුද්ධිය ඇතුලු සෙසු විශුද්ධිත්‍රය බව වටහාගත යුතුය. මේ අනුව සප්ත විශුද්ධි ක්‍රමය තුළ දැක්වෙන්නේද අපි මේ ලිපි පෙළින් දක්වන ත්‍රිලක්ෂණ අර්ථම බව නුවණැතියෝ වටහා ගනිත්වා.

මෙසේ පෙර පරිච්ඡේදවලින් දක්වන ලද අර්ථ ඇති ත්‍රිලක්ෂණයෙන් යුත් විපස්සනා ප්‍රතිපදාව නාමරූපපරිග්ගහණාදී තුන් පියවරින් යුත් ප්‍රතිපදාවක් සේ බහුතර සූත්‍රයන්හිත් සප්ත විශුද්ධිය ලෙස රථවිනීත සූත්‍රයෙහිත් දෙයාකාර වූම ප්‍රතිපදාව න්‍යායාත්මක වශයෙන් අසූහාර දහසක් ධර්මස්කන්ධයන්හිත් පැමිණියාහුය. ඒ අනුව ත්‍රිපිටකයෙහි ත්‍රිලක්ෂණය දක්වන සැම තන්හිම මේ අර්ථයෙන්ම ත්‍රිලක්ෂණය දැක්වූ බව නැණවත්හු දතයුත්තාහ.

## II. සතර මහා අපදේශ න්‍යායෙන් ත්‍රිලක්ෂණය

අනාගතයෙහි පරියාප්ති ශාසනයට යම් යම් අධර්මානුකූල දුර්මත ඇතුළු විය හැකි බව දත් භාග්‍යවතුන්වහන්සේ එබඳු අවස්ථාවක ධර්මවිනය වෙන් කොට හඳුනා ගැනීම සඳහා සතර මහා අපදේශයන් වදාළ සේක. මෙහිදී ධර්ම පරියාය සඳහා එක් ක්‍රමයකුත් විනය පරියාය සඳහා එක් ක්‍රමයකුත් වදාළසේක. ඒහිදී ධර්ම පරියාය සඳහා වූ ක්‍රමය භාග්‍යවතුන්වහන්සේ මහා පරිනිබ්බාණ සූත්‍රයෙහි මෙසේ වදාළ සේක.

- මහා පරිනිබ්බාන සූත්‍රයෙහි - මහා අපදේශ

**"ඉධ, භික්ඛවෙ, භික්ඛු එවං වදෙය්‍ය – 'සම්මුඛා මෙතං, ආවුසො, භගවතො සුතං සම්මුඛා පටිග්ගහිතං, අයං ධම්මො අයං විනයො ඉදං සත්ථුසාසන'න්ති. තස්ස, භික්ඛවෙ, භික්ඛුනො භාසිතං නෙව අභිනන්දිතබ්බං නප්පටික්කොසිතබ්බං. අනභිනන්දිත්වා අප්පටික්කොසිත්වා තානි පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා සුත්තෙ ඔතාරෙතබ්බානි , විනයෙ සන්දස්සෙතබ්බානි. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි න චෙව සුත්තෙ ඔතරන්ති, න ච විනයෙ සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං – 'අද්ධා, ඉදං න චෙව තස්ස භගවතො වචනං; ඉමස්ස ච භික්ඛුනො දුග්ගහිත'න්ති. ඉතිහෙතං, භික්ඛවෙ, ඡඩ්ඩෙය්‍යාථ. තානි චෙ සුත්තෙ ඔතාරියමානානි විනයෙ සන්දස්සියමානානි සුත්තෙ චෙව ඔතරන්ති, විනයෙ ච සන්දිස්සන්ති, නිට්ඨමෙත්ථ ගන්තබ්බං – 'අද්ධා, ඉදං තස්ස භගවතො වචනං; ඉමස්ස ච භික්ඛුනො සුග්ගහිත'න්ති. ඉදං, භික්ඛවෙ, පඨමං මහාපදෙසං ධාරෙය්‍යාථ."**

*එහි දී භාග්‍යවතුන් වහන්සේ මහණුන් කැඳවා, "මහණෙනි, සතර මහා අපදේශයන් දෙසන්නෙමි. එය අසවු, මොනොවට සිත්හි කරවු, කියන්නෙමි" යි වදාළ සේක. 'එසේ යැ වහන්සැ ' යි ඒ මහණහු භගවත් බුදුරජුනට පිළිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක: "මහණෙනි, මෙහි මහණෙක්, 'ඇවැත්නි, ධර්මය මේ යැ, විනය මේ යැ, ශාස්තෘශාසනය මේ යැ' යි භාග්‍යවතුන් වහන්සේ හමුයෙහි සිට මා විසින් මෙය අසන ලද්දේ ය, භාග්‍යවතුන් වහන්සේ හමුයෙහිදී පිළිගන්නා ලද්දේ යැ' යි මෙසේ කියන්නේ නම්, මහණෙනි, (එ පමණින්) එ මහණහුගේ වචනය නො ම පිළිගත යුතු, නො ද පිළිකෙවු කළ යුතු. නො ම පිළිගෙන, නො ද පිළිකෙවු කොට, ඒ පද ව්‍යංජන මොනොවට ඉගෙන සූත්‍රයෙහි බහා ලියැ යුතු, විනයෙහි සැසැඳියැ යුතු. ඉදින් සූත්‍රයෙහි බහාලනු ලබන්නාහු, විනයයෙහි සසඳනු ලබන්නාහු සූත්‍රයෙහි නො බස්නාහු ද, විනයයෙහි නො සැසැඳෙන්නාහු ද, එවිටැ*

*'ඒකාන්තයෙන් මෙය ඒ භාග්‍යවතුන් වහන්සේගේ වචන නො වේ, මෙය මේ මහණහු වරදවා ගත් දැයෙකැ' යි මෙහි නිෂ්ඨාවට පැමිණියැ යුතු. මහණෙනි, මෙසේ මෙය බැහැර කරවු. ඉදින් ඒ පද ව්‍යඤ්ජනයෝ සූත්‍රයෙහි බහාලනු ලබන්නාහු, විනයෙහි සසඳනු ලබන්නාහු, සූත්‍රයෙහිත් බැසැගනිත් ද විනයෙහිත් සැසැඳෙත් ද, එ විටැ 'ඒකාන්තයෙන් මෙය ඒ භාග්‍යවතුන් වහන්සේගේ වචන යැ, යි මේ මහණහු විසින් මෙය මොනොවට උගන්නා ලදැ' යි නිෂ්ඨාවට යැ යුතු. මහණෙනි, මෙසේ මේ පළමු මහා අපදේශය සිත්හි ලා දරවු.* (දීඝනිකාය II - මහා පරිනිබ්බාණ සූත්‍රය - බු.ජ.මු. 192)

මේ සූත්‍ර පාඨයට අර්ථ සපයන, භාග්‍යවතුන් වහන්සේගේ සංක්ෂිප්ත දේශනා අර්ථ ව්‍යඤ්ජන වශයෙන් විස්තර කර දක්වන්නවුන් අතර අග්‍රස්ථානයට පත් මහා කච්චායන මහරහතන් වහන්සේ නෙත්තිප්පකරණයෙහි යුක්තිහාරයෙහි මෙසේ වදාළ සේක.

- <u>නෙත්තිප්ප්‍රකරණය - මහා අපදේශ</u>

**"ඉමෙ චත්තාරො මහාපදෙසා, තානි පදබ්‍යඤ්ජනානි සුත්තෙ ඔතාරයිතබ්බානි, විනයෙ සන්දස්සයිතබ්බානි, ධම්මතායං උපනික්ඛිපිතබ්බානි. කතමස්මිං සුත්තෙ ඔතාරයිතබ්බානි? චතූසු අරියසච්චෙසු. කතමස්මිං විනයෙ සන්දස්සයිතබ්බානි? රාගවිනයෙ දොසවිනයෙ මොහවිනයෙ. කතමියං ධම්මතායං උපනික්ඛිපිතබ්බානි? පටිච්චසමුප්පාදෙ. යදි චතූසු අරියසච්චෙසු අවතරන්ති, කිලෙසවිනයෙ සන්දිස්සන්ති, ධම්මතඤ්ච න විලොමෙන්ති, එවං ආසවෙ න ජනෙන්ති. චතූහි මහාපදෙසෙහි යං යං යුජ්ජති, යෙන යෙන යුජ්ජති, යථා යථා යුජ්ජති, තං තං ගහෙතබ්බං."**

*මොහු සතර මහා - අපදෙසයෝ යි. (කිසිවක්හු විසින් එළවනලද සූත්‍රයක හෝ සංවර්ණකයා විසින් සංවර්ණනාවශයෙන් ලබන සූත්‍රයාගේ හෝ) ඒ අර්ථපද ව්‍යඤ්ජනපදයෝ සූත්‍රයෙහි බහාලියැයුත්තාහ විනයෙහි ලා සසඳාලියැයුත්තාහ, ධර්මතායෙහි බස්වාලියැයුත්තාහ. කවර සූත්‍රයෙක අවතරණ කළ යුත්තාහ යත්: සතර ආර්‍ය්‍යසත්‍යසූත්‍රයෙහි යැ. කවර විනයෙක සසඳාලියැ යුත්තාහ යත්: රාගවිනයෙහි දෝසවිනයෙහි මෝහවිනයෙහි යැ. කවර ධර්මතායෙක බස්වාලියැයුත්තාහ යත්: ප්‍රතීත්‍යසමුත්පාද ධර්මතායෙහි යි. ඉදින් චතුරාර්‍ය්‍යසත්‍යයෙහි බැසැගනී නම්, ක්ලේශවිනයෙහි ලා සැසැඳේ නම්, ධර්මතාවට ද විරුද්ධ නොවේ නම් මෙසේ කාමාදි ආස්‍රවයන් නූපදවා නම්, සතර මහාපදේසයන් හා යම් යම් අර්ථධර්ම, ජාතයෙක් යෙදේද, යම් යම් කරුණෙකින් යෙදේ ද, යම් යම් ප්‍රකාරයෙකින් යෙදේ ද ඒ ඒ අර්ථධර්මජාතය( සූත්‍රයෙන් නඟා සංවර්ණනාවශයෙන්) ගතයුත්තේ යි.* (නෙත්තිප්පකරණය - යුත්තිහාර විභංගය - බු.ජ.මු. 38)

මෙහිදී සංක්ෂිප්තව දේශනා කළ සුගත න්‍යාය විස්තර කරන කච්චායන මහරහතන් වහන්සේ "අසන ලද නව දහම් මතය සූත්‍රයෙහි බහාලිය යුතුය, විනයෙහි සැසඳිය යුතුය, ධර්මතායෙහි එළවා බැලිය යුත්තේ"යැයි දේශනා කොට "කවර සූත්‍රයෙක්හිද යත් චතුරාර්ය සත්‍යයෙහිය, කවර විනයෙක්හි ද යත් රාග ද්වේශ මෝහ විනයෙහි හික්මවීමෙහිය, කවර ධර්මතායෙක් හිද යත් පටිච්චසමුප්පාදයෙහි" යැයි තවදුරටත් අර්ථ විග්‍රහ කළ සේක.

- <u>නෙත්තිප්පකරණ අර්ථ කථාව - මහා අපදේශ</u>

මෙම නෙත්තිප්පකරණ පාඨයට අර්ථ විග්‍රහ කරන අර්ථකථාචාරී බදිරතීර්ථවාසි ධම්මපාල ස්වාමීන් වහන්සේ තම්බපණ්ණිදීපයෙහි මහාවිහාරවාසී මහාරහතන් වහන්සේලාගේ මතය නොඉක්මවමින් නෙත්තිප්පකරණ අර්ථකථාවෙහි මෙසේ දක්වයි.

**ධම්මතායන්තිපදස්ස අත්ථං දස්සෙතුං ‘‘පටිච්චසමුප්පාදෙ’’ති වුත්තං. පටිච්චසමුප්පාදො හි ඨිතාව සා ධාතු ධම්මට්ඨිතතා ධම්මනියාමතාති  වුත්තො. ‘‘ධම්මතායං උපනික්ඛිපිතබ්බානී’’ති ඉදං පාළියං නත්ථි, අත්ථදස්සනවසෙන පන ඉධ වුත්තන්ති දට්ඨබ්බං. එත්ථ ච පවත්තිං නිවත්තිං තදුපායඤ්ච බාධකාදිභාවෙ නියතං පරිදීපෙන්තො සුත්තෙ ඔතරති නාම. එකන්තෙන රාගාදිකිලෙසවිනයං වදන්තො විනයෙ සන්දිස්සති නාම. තථා සස්සතං උච්ඡෙදඤ්ච වජ්ජෙත්වා එකත්තනයාදිපරිදීපනෙන සභාවධම්මානං පච්චයපච්චයුප්පන්නභාවං විභාවෙන්තො ධම්මතං න විලොමෙති නාම.**

**එවංවිධො ච කාමාසවාදිකං ආසවං න උප්පාදෙතීති ඉමමත්ථං දස්සෙන්තො ‘‘යදි චතූසු අරියසච්චෙසූ’’ති ආදිමාහ. නනු ච අනුලොමතො පටිච්චසමුප්පාදො පවත්ති, පටිලොමතො නිවත්තීති සො චත්තාරි අරියසච්චානි අනුපවිට්ඨො කස්මා ඉධ විසුං ගහිතොති? සච්චමෙතං. ඉධ පන විසුං ගහණං ධම්මානං පච්චයායත්තවුත්තිදස්සනෙන අනිච්චපච්චයලක්ඛණං අසමත්ථපච්චයලක්ඛණං නිරීහපච්චයලක්ඛණඤ්ච විභාවෙත්වා තෙසං උදයවන්තතා තතො එව වයවන්තතා තදුභයෙන අනිච්චතා උදයබ්බයපටිපීළනෙන දුක්ඛතා අනත්තතාති තිලක්ඛණසමායොගපරිදීපනී සබ්බදිට්ඨිගතකුමතිවිද්ධංසනී අනඤ්ඤසාධාරණා සාසනසම්පත්ති පකාසිතා හොතීති දස්සනත්ථං.**

*‘**ධම්මතායං**’ යන පදයේ අර්ථය දක්වන්නට ‘**පටිච්චසමුප්පාදෙ**’ යයි වදාරණ ලදී.  පටිච්චසමුප්පාදය වනාහි ‘‘ අවිද්‍යාදී ප්‍රත්‍යන්ට  ආයත්තව සංඛාරාදී  ප්‍රත්‍යෝත්පන්නයන් උපදින බැවින් ‘ධම්මට්ඨිතිතා’ ඇති බැවින්ද  අවිද්‍යාදී  ප්‍රත්‍යයන් විසින් හසුරුවන හෙයින් ‘ධම්මනියාමතා’ ඇති බැවින් ද බුදුන් උපන් කල්හි ද නූපන් කල්හි ද ඒ ප්‍රත්‍ය ස්වභාවය සිටියේ ම ය’’ යන ආකාරයෙන් භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරණ ලද්දේය. ‘ධම්මතායං  උපනික්ඛිපිතබ්බාති’ යන මේ කොටස  දීඝනිකායේ පරිනිබ්බාණ සූත්‍රයෙහි සතරමහාපදේශ වදාරණ ලද තැන පාලියෙහි නැත. අර්ථය දීපනය කිරීම් වශයෙන් ඒ කොටස කච්චායනමහරහතන් වහන්සේ විසින් මේ නෙත්තිප්පකරණයෙහි වදාරණ ලද්දේ යයි දතයුතුය. මෙහිලා ද සංසාර ප්‍රවෘත්තිය සංසාර ප්‍රවෘත්තියේ නැවතීම එය නවතනු ලබන උපාය බාධක ආදීභාවයෙහි නියමය මනාව දීපනය කරනුයේ ‘සුත්තෙ ඔතරති’ නම් වේ. ඒකාන්තයෙන් රාගාදී කිලෙස විනයනය  කියනුයේ ‘විනයෙ සන්දිස්සති’ නම් වේ. එසේම ශාස්වත උච්ඡේද වතය වර්ජනය කොට  ඒකත්තනය  ආදිය දැක්වීමෙන් ස්වභාව ධර්‍මයන්ගේ ප්‍රත්‍යය ප්‍රත්‍යෝත්පන්නභාවය බබලවනුයේ ‘‘ධම්මතං න විලොමෙති’’ නම් වේ. මේ ආකාර වූ ද කාමස්‍රව ආදී ආස්‍රව නො උපදවයි යන මේ අර්ථය දක්වනුයේ ‘යදි  අරියසච්චේසු’ යන ආදිය වදාළේය. පටිච්චසමුප්පාදය අනුලෝමයෙන් සංසාර ප්‍රවෘත්තිය ද  පටිලෝමයෙන් සංසාර නිවෘතිය ද කියනුයේ නොවේද?  ඒ පටිච්ච සමුප්පාදය චතුරාර්ය සත්‍යය තුළට පිවිසියේ ය. කවර හෙයින් මෙහි වෙනම ගන්නා ලද්දේ ද?*

*එය සත්‍යයකි. මෙහි වනාහි වෙනම ගැනීමෙන් ස්වභාවධර්මයන්ගේ ප්‍රත්‍යන්ට ආයත්ත වූ පැවතුම් දැක්වීම් වශයෙන් ප්‍රත්‍යයන්ගේ අනිත්‍ය ලක්ෂණය, ප්‍රත්‍යයන්ගේ අසමර්ථ ලක්ෂණය, අකර්මණ්‍ය ලක්ෂණය ද බබුළුවා ඒ ස්වභාව ධර්මයන්ගේ හටගැනීම් ලක්ෂණයෙන් යුක්ත බව එයින්ම බිඳෙන ලක්ෂණයෙන් යුක්ත බව ඒ උදයවැය දෙක කරණ කොට ගෙන 'අනිත්‍යතාව' උදය වැය දෙකින් පෙළෙන හෙයින් 'දුක්ඛතා' ව හා 'අනාත්මතාව' යන ත්‍රිලක්ෂණ සමායෝජනය දක්වනුයේ ඒ ත්‍රිලක්ෂණාදිය පිළිබඳව ඇති සියළු සාවද්‍ය දෘෂ්ටි දුර්මත විධ්වංසනය කරනුයේ අන්‍ය ශාස්තෲ ශාසන හා අසාධාරණ වූ ශාසන සම්පත්තිය දක්වන ලද්දේ වෙයි යන්න දැක්වීම පිණිස වදාරණ ලදී.* (නෙත්තිප්පකරණට්ඨකථා යුත්තිහාරවිභඞ්ගය- පි .හේ.මු.69)

මෙහිදී ප්‍රස්තුතයට බඳුන් වී ඇති කාරණාව වනුයේ අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණ ධර්මයන්ගේ නිවැරදි ධර්මාර්ථය කුමක්ද යන්නයි. සංක්ශේපයෙන් සංස්කාරයන්ගේ පෙර නොතිබීම ඉපිද නිරවශේෂයෙන් නිරුද්ධ වීයාම අනිත්‍ය ලෙස ද ඉපදීම් බිඳීම් දෙකින් පෙළෙන හෙයින් දුක්ඛ ලෙස ද වසඟයෙහි නොපැවැත්විය හැකි බැවින් අනාත්ම ලෙස ද අර්ථ දැක්විය හැක.

- <u>ත්‍රිලක්ෂණ අර්ථයන් සූත්‍රයෙහි බහාලීම</u>

ඉහත නෙත්තිප්පකරණ අර්ථ කතාවෙහි 'සුත්තෙ ඔතරෙතබ්බා' යන්නට අර්ථකථාචාරීන්වහන්සේලා ලබාදුන් චතුරාර්ය සත්‍යයෙහි බහාලා බැලිය යුතුය යන අර්ථය හා ත්‍රිලක්ෂණය පිළිබඳ අර්ථය මෙසේ සැසඳිය හැක.

<u>දුක්ඛ ආර්ය සත්‍ය හා සැසඳීම</u>

ත්‍රිලක්ෂණයට නංවනුයේ නාම රූප ධර්මයෝ ය. ත්‍රිලක්ෂණය ඇත්තේ ද නාම රූප ධර්මයන්ට ය. පංච උපාදානස්කන්ධය යැයි කියනුයේ ද නාම රූපයන්ට මය. " සංඛිත්තේන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා" යන බුද්ධ දේශනාවට අනුව නාමරූපයෝ දුක්ඛආර්ය සත්‍යයට ඇතුලත් වෙත්. ඉහත ත්‍රිලක්ෂණය අර්ථදැක්වීමෙහි නාම රූපයන් පිළිබඳව ද දැක්වෙන හෙයින් ඉහත ත්‍රිලක්ෂණ අර්ථ දැක්වීමෙන් දුක්ඛ ආර්ය සත්‍ය නිරූපණය වේ.

<u>දුක්ඛ සමුදය ආර්ය සත්‍යය හා සැසඳීම</u>

නාම රූපයන් ත්‍රිලක්ෂණයට නැංවීමේදී තෘෂ්ණාව හෙවත් ලෝභ චෛතසිකය ද ත්‍රිලක්ෂණයට නංවයි. එබැවින් තෘෂ්ණාව දුක්ඛ සමුදය නිසා ඉහත ත්‍රිලක්ෂණ අර්ථ දැක්වීමෙන් දුක්ඛ සමුදය ආර්ය සත්‍යය නිරූපණය වේ.

<u>දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය හා සැසඳීම</u>

ඉහත විශුද්ධි විස්තරයේදී පටිපදා ඤාණ දස්සන විශුද්ධියේ දී ප්‍රත්‍ය ධර්මයන් සතර වය ලක්ෂණය හා යොදා ස්කන්ධයන්ට නංවමින් ප්‍රත්‍යයන්ගෙන් නිරෝධය මෙනෙහි කිරීමෙන් ප්‍රත්‍යයන්ගේ අනුත්පාද නිරෝධයෙන් ස්කන්ධයන්ගේ අනුත්පාද නිරෝධය සිදුවන බව දැන සත්වන ඤාණදස්සන විශුද්ධියේ

දී නිවන අරමුණු කිරීමෙන් නිරෝධ සත්‍යය වන නිවන ද මේ ත්‍රිලක්ෂණ අර්ථ දැක්වීමෙන් නිරූපණය විය. එහෙයින් මේ ලක්ෂණ අර්ථ දැක්වීම තුළින් දුක්ඛ නිරෝධාර්ය සත්‍යය ද නිරූපණය වේ.

<u>දුක්ඛ නිරෝධගාමිණී ආර්ය සත්‍යය හා සැසඳීම</u>

ඉහත ඡේදයෙක්හි දක්වන ලද සප්ත විශුද්ධි ක්‍රමය තුළ මේ ත්‍රිලක්ෂණ අර්ථ ඇතුලත් වේ. මෙසේ මේ ත්‍රිලක්ෂණ ධර්ම විග්‍රහයේදී ඒ සංසාර නිවෘත්තියගේ උපාය ප්‍රතිපදාව වන නිර්වාණගාමී විපස්සනා ප්‍රතිපදාව නිරූපණය වේ. එහෙයින් මේ ත්‍රිලක්ෂණ අර්ථ දැක්වීම තුළින් දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදා ආර්ය සත්‍යය නිරූපණය වේමය.

මෙසේ දක්වන ලද ත්‍රිලක්ෂණයන්ගේ අර්ථය තුළින් චතුරාර්ය සත්‍යය නිරූපණය වේ යන්න පැහැදිලිය. එමෙන්ම මේ ආකාරයට චතුරාර්ය සත්‍ය හා සැසඳූ කල මැනවින් එහි බැස ගන්නා බවද පැහැදිලිය. මෙතෙකින් සූත්‍රයෙහි බහාලූ කල මනාව සූත්‍රයෙහි බැසගන්නා බැවින් ද භාග්‍යවතුන් වහන්සේගේ වචනයට සම වන බැවින් ද මේ ත්‍රිලක්ෂණ අර්ථ මැනවින් සූත්‍රයෙහි බැස ගන්නේ යයි දරා ගත යුතුය.

- <u>විනයෙහි සංසන්දනය කිරීම</u>

ඉහත සප්ත විශුද්ධි ක්‍රමයෙන් මෙකී ත්‍රිලක්ෂණ අර්ථයන් යොදා ගෙන නිවන් සාක්ෂාත් කළ හැකි බව ඉහත දක්වන ලදී. (විස්තර සොයන්නවුන් විසින් විශුද්ධි මාර්ගය හා එහි පරිවාර ටීකා සන්න ආදී ග්‍රන්ථයන්ගෙන් බලා දත යුතුය) එයින්මේ ත්‍රිලක්ෂණ අර්ථ යොදාගෙන මාර්ගය වැඩීමෙන් රාග විනයනය ද්වේශ විනයනය මෝහ විනයනය සිදුවන බව මැනවින් පැහැදිලිය. මෙසේ රාග විනයනය සිදුවන හෙයින් භාග්‍යවතුන් වහන්සේගේ වචනයට මේ ත්‍රිලක්ෂණ අර්ථ සම වන බව දත යුතුය. එබැවින් විනය සමග මැනවින් මේ ත්‍රිලක්ෂණ අර්ථ සැසඳෙන බව පැහැදිලිය.

- <u>ධර්මතායෙහි හෙවත් පටිච්ච සමුප්පාදයෙහි බහාලීම</u>

මෙම ත්‍රිලක්ෂණ අර්ථකථනය සප්ත විසුද්ධිය තුළට ඇතුළත්කොට කතා කෙරෙන බැවින් කංඛාවිතරණ විශුද්ධිය ගත්කළ ත්‍රිලක්ෂණය ගන්නා ලද්දේ ම වෙයි. යම් සේ දරුවාගේ අතින් ගත් කල අත දරුවාගේ ශරීරයේ කොටසක් බැවින් දරුවා ගත්තේ යැයි කියන්නා සේ සප්ත විශුද්ධිය තුළ ත්‍රිලක්ෂණය අඩංගු බැවින් ත්‍රිලක්ෂණය ගත්කළ සප්ත විසුද්ධිය ම ගන්නා ලද්දේ වෙයි. බැවින් ත්‍රිලක්ෂණය ගත් කල කංඛාවිතරණ විශුද්ධිය ද ගන්නා ලද්දේ ම වෙයි. කංඛාවිතරණ විශුද්ධිය යනු නාම රූප ධර්මයන්ගේ ප්‍රත්‍යාන්ට ආයක්ත වූ පැවතුම් ඇති බව දැක්වීමමය. අවිද්‍යා පච්චයා සංඛාරා යයි කී කල්හි සංඛාරයන්ගේ ඇති අවිද්‍යාවට ආයක්ත බව ප්‍රකටය. විඤ්ඤාණ පච්චයා නාම රූප යයි කී කල නාම රූපයන්ගේ ඇති විඤ්ඤාණයට ආයක්ත බව මැනවින් පැහැදිලිය. මේ අනුව ත්‍රිලක්ෂණය කී කල අපදේශයෙහි පැමිණි පටිච්චසමුප්පාදය නිරූපණය වන බව පැහැදිලිය.

තවද සමපනස් උදය වැය පරීක්ෂාවෙහි දී ද නාම රූපයන්ගේ ඇති ප්‍රත්‍යාන්ට ආයක්ත බව මැනවින් ප්‍රකට ය. එහිදී අවිද්‍යා කර්ම තෘෂ්ණා කබලිංකාකාර ආහාර යන ප්‍රත්‍යයන්ගේ ඉපදීමෙන් රූප

උපදින බව මෙනෙහි කෙරේ. ඒ හේතූන්ගේ අනුත්පාද නිරෝධයෙන් රූප නිරෝධ වන බව මෙනෙහි කෙරේ. මේ අනුව රූප ධර්ම ප්‍රත්‍යාන්ට යටහත් පැවතුම්වලින් හෙවත් ආයක්තව සිටින බව පැහැදිලිය.

එසේම අවිද්‍යා කර්ම තෘෂ්ණා ඵස්ස යන ප්‍රත්‍යාන්ගේ ඉපදීමෙන් නාම උපදින බව මෙනෙහි කෙරේ. ඒ හේතූන්ගේ අනුත්පාද නිරෝධයෙන් නාම නිරෝධ වෙන බව මෙනෙහි කෙරේ. මේ අනුව නාම ධර්මද ප්‍රත්‍යාන්ට යටහත් පැවතුම්වලින් හෙවත් ආයක්තව සිටින බව පැහැදිලිය.

ඉහත දක්වන ලද ත්‍රිලක්ෂණ අර්ථයන් සප්ත විශුද්ධිය තුළ අන්තර්ගත හෙයින් මේ ත්‍රිලක්ෂණ අර්ථ විග්‍රහ කිරීමේදී කංඛාවිතරණ විශුද්ධිය හෙවත් පටිච්චසමුප්පාදයද මතුව පෙනේ. එබැවින් දක්වන ලද ත්‍රිලක්ෂණ අර්ථ යොදා ගෙන විපස්සනාව වඩන ක්‍රමය තුලින් අපදේශයෙහි පැමිණි පටිච්චසමුප්පාදය නිරූපණය වන බව පැහැදිලිය.

තවද ඉහත අර්ථකථා පාඨයෙහි පැමිණි “තෙසං උදයවන්තතා තතො එව වයවන්තතා තදුභයෙන අනිච්චතා උදයබ්බයපටිපීළණෙන දුක්ඛතා අනත්තාති තිලක්ඛණසමායොග පරිදීපනී” යන පාඨයෙන් විවාදයෙන් තොරවම ත්‍රිලක්ෂණය සඳහා මෙහි ඉදිරිපත් කළ අර්ථකථනය ම යොදා ගත යුතු බව සක්සුදක් සේ පැහැදිලිය. මෙයින් ද මේ ත්‍රිලක්ෂණ අර්ථකථනය තුළින් අපදේශයෙහි පැමිණි පටිච්චසමුප්පාදය නිරූපණය වන බව පැහැදිලිය. එබැවින් ත්‍රිලක්ෂණ සඳහා භාග්‍යවතුන් වහන්සේගේ අර්ථකථනය වූයේ ද මෙය ම බව ඉතා මැනවින් පැහැදිලිය. මෙසේ “ධම්මතාය උපනික්ඛිපතබ්බානි” යන ශ්‍රී මුඛ දේශනාව හා මේ ත්‍රිලක්ෂණ අර්ථකථනය සම වන බව දත යුතුය.

මෙසේ මේ ත්‍රිලක්ෂණ අර්ථකථනය සතරමහාපදේශයන් අනුව සලකා බැලූ කල සූත්‍රයෙහි මනාව බැස ගනී. විනය හා මැනවින් සැසඳේ. ධර්මතායෙහි මනාව බැස ගනී.එබැවින් සැදැහැවත්හු මේ ත්‍රිලක්ෂණ අර්ථකථනය ජීවමාන ශාස්තෘන් වහන්සේ සම්මුඛයේ අසන්න ලද්දක් සේ දරාගත යුත්තාහ. සංගීතිකාරක මහරහත් බුද්ධ පුත්‍රයන් වහන්සේලා අභිමුඛයෙහි අසන ලද්දක් සේ දරාගත යුත්තාහ. ආචාර්ය පරම්පරාවෙන් පැමිණුනා වූ ධර්මාර්ථය ම බව දරාගත යුත්තාහ.

## III. අන්තර්ගතය සැකෙවින්

මෙසේ මේ ත්‍රිලක්ෂණ ධර්මයන්ගේ පෙළ අර්ථකථා ටීකා ආදියෙන් පැමිණි දහම් අර්ථය ලිපි මාලාවකින් දක්වන ලදී. එහිදී ත්‍රිලක්ෂණයන්ගේ වචනාර්ථ ආදිය ද එකී අර්ථයන් පෙළ අර්ථකථා ආදියෙහි දක්වා ඇති ආකාරය ද මෑත යුගයේ බුරුම හා ලංකාද්වීපයේ ධර්මධර විනයධර යෝගාවචර ස්වාමීන්ද්‍රයන් වහන්සේලා විසින් එකී අර්ථ මතු කරමින් භාවනා ක්‍රම පුහුණු කරන ආකාරය ද නිදසුන් සහිතව දැක්වීමු.

ඉන් අනතුරුව එකී ත්‍රිලක්ෂණ අර්ථයන් යොදාගෙන භාවනා වඩා නිවන් සාක්ෂාත් කළ හැකි ආකාරය ද සූත්‍ර නිදසුන් දක්වමින් පැහැදිලි කළෙමු. අනතුරුව එකී දහම් අර්ථයන් සප්ත විශුද්ධිය තුළට බහා මගඵල නිවන් සාක්ෂාත් කළ හැකි බව දැක්වීමු. අවසානයේ දී යම් දහම් අර්ථයක් ලැබුණු කළ එය ශාස්තෲ දේශනාවදැයි නිගමනය කර ගැනීම සඳහා භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ සතර මහාපදේශයන්හි බහා මේ ත්‍රිලක්ෂණ ධර්මාර්ථය ශ්‍රී මුඛ බුද්ධ වචනය ම බව තහවුරු කළෙමු.

මෙසේ මේ ක්‍රමයෙන් තහවුරු කරනු ලැබූයේ අනෙකක් නොව බුද්ධ ශාසනයේ හරයයි. කල්ප අනන්ත අපරිමාණ කාලයක් ඇස් හිස් මස් ලේ රට රාජ්‍ය අඹු දරු දන් දෙමින් අප්‍රමාණ දුක්ඛස්කන්ධයක් විඳි මහබෝසතාණන් වහන්සේලා උතුම් ලොව්තුරා බුදු පදවි ලබනුයේ අන් කිසිවක් පිණිස නොව මේ ත්‍රිලක්ෂණ අර්ථය මතුකර දක්වා ලෝසතුන් නිවන්පුර හැරලනු පිණිසය. ඉදින් යම් කලෙක ඒ දහම් අර්ථ වැළලී ගිය හොත් අනන්ත සසර දුක් විඳින ලෝ සතුන්ට සසර දුකින් මිදී යන්නට ලැබුණු මේ ශාසන ක්ෂණසම්පත්තිය වැනසී යන්නේය. අෂ්ඨ දුෂ්ක්ෂණයන් ගෙන් වෙන් ව ලැබුණු උතුම් මනුස්ස ප්‍රතිලාභය නිරර්ථක වන්නේය.එබැවින් සද්ධම්මස්ථිතිකාමීහු මේ දහම් අර්ථ අසත්වා. ඇසූ දහම් අරුත් දරාගනිත්වා. දහම් අර්ථ වලට අනුව භාවනා වඩත්වා. අන් සතුන් කෙරෙහි කරුණාවෙන් පහදා දෙත්වා.

මෙසේ ශාසනස්ථිතිය පිණිස මේ ලිපි පෙළ සකස් කිරීමෙන් රැස් වූ සියළු කුශල ධර්මයන් ගේ ආනුභාවයෙන් ඒ ශාක්‍යසිංහ සුගත තථාගතයන් වහන්සේ පැවැත්වූ දහම් සක බබුළුවන්නා වූ ථේරවාදී මහාවිහාර භික්ෂු පරම්පරාව ශාසනන්තර්ධානය තෙක් යෙහෙන් වැජඹේවා. මේ නිර්මල බුද්ධ ශාසනය සියළු ලෝ සතුනට දෙලෝ වැඩ සාදමින් වසර පන්දහසක් කල් බබලාවා. ථේරවාදී නිර්මල බුද්ධ ශාසනයට පණපොවන්නා වූ ධර්මධර විනයධර ධර්මානුධම්ම ප්‍රතිපන්න තෛනිකායික සියලු සුපේශල ශික්ෂාකාමී මහාසංඝරත්නය එක්සිත්ව සමගිව සසුන් දම් පුරා බුදු සසුන බබුළුවා ස්වාර්ථ පරාර්ථ වැඩ සාදා බඹසර කිස නිමවා උතුම් නිවනින් සැනසේවා. සියළු ලෝක සත්ත්වයෝ ශීල සමාධි ප්‍රඥා පිළිවෙත් දම් පුරා සියළු දුක් කෙළවර කොට අත්‍යුත්තම වූ ශාන්ති ලක්ෂණ නිවනින් නිවී සැනසෙත්වා. මෙසේ මෙතෙකින් ත්‍රිලක්ෂණය පිළිබඳ සුගතවාදය වූ ත්‍රිලක්ෂණය පිළිබඳ ථෙරවාදී මහාවිහාර මතය වූ "ත්‍රිලක්ෂණ විනිශ්චය" නිමියේය.

-මහා විහාරය-